# බ්‍රිතාන්‍ය පාලනය යටතේ රාජ්‍ය සහ ආගම අතර සම්බන්ධය පිළිබඳ විග්‍රහයක්

කථිකාචාර්ය අජිත් තල්වත්ත

ලංකාවේ රාජ්‍ය පාලනයත් බෞද්ධාගමත් දැඩි සම්බන්ධතාවයකින් යුක්තය. පැරැන්නන් නිසැකවම මෙම තත්ත්වය හොඳින් තේරුම්ගෙන සිටියහ. ලංකා ඉතිහාසය යනු බුද්ධාගමේම ඉතිහාසය යැයි ඔවුහු විශ්වාස කළහ.[1] පාලනය කිරීම යන්නට බෞද්ධාගම ආරක්ෂා කිරීම, පවත්වාගෙන යාමට ආධාර දීම, දියුණු කිරීම, ආදී කාර්යයන් ද අඩංගු යැයි ඔවුහු විශ්වාස කොට ඇත. ලංකා ඉතිහාසය පිළිබඳ සත්‍ය තොරතුරු ලබාගත හැකි කාලයේ සිටම රාජ්‍ය සහ ආගම අතර ඇතිවුණු සම්බන්ධයේ මූලික ලක්ෂණ අද දක්වා පවතී. වර්තමාන යුගයේ සිදුවන ඇතැම් සිද්ධීන් ගැන වුව ද කල්පනාකර බලන්නෙකුට ලංකාවේ දේශපාලනය සහ බෞද්ධාගම අතර කොතරම් දැඩි සම්බන්ධතාවක් තිබේද යන්න හා භික්ෂූන් වහන්සේලා දේශපාලනය කෙරෙහි කොතරම් ප්‍රබල බලපෑමක් කළ හැකි පිරිසක් ද යන්න පෙනී යන කරුණකි.

රාජ්‍ය වූ කලී බොහෝ දුරට මනුෂ්‍යයන්ගේ ලෞකික සුභසාධනය සඳහා සකස් වූ ආයතනයකි. ආගම ලෝකෝත්තර ශුභ සිද්ධිය පදනම් කොට ඇති වූවකි. පැරණි ලාංකික සමාජය ලෞකික දියුණුව මෙන්ම ලෝකෝත්තර දියුණුව එකසේ සැලකූ බව පැහැදිලිය.[2] ඒ නිසා අන්ත දෙකක බලාපොරොත්තු ඉටු කළ රාජ්‍යයත් ආගමත් සමාජය තුළ එකතු වී තිබේ. මෙම තත්ත්වය පැහැදිලිව දක්නට ඇත්තේ බෞද්ධාගම මෙරටට පැමිණීමෙන් පසුවය. එතැන් සිට මෙරට අධිරාජ්‍යවාදයට නතුවනතෙක් පැවතුනේ රාජ්‍ය සහ ආගම අතර දැඩි සම්බන්ධතාවයකි. විශේෂයෙන්ම මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරනු ලබන්නේ 1796 සිට 1847 දක්වා වූ කාලය තුළ බ්‍රිතාන්‍යයන් හා බෞද්ධාගම අතර පැවතුන ප්‍රතිපත්තිය පිළිබඳ විග්‍රහ කිරීමටය.

මුහුදු බඩ පළාත් කේන්ද්‍රගත ලෙස බලය ගොඩ නැගූ බ්‍රිතාන්‍යයෝ පාලක පක්ෂය හා බෞද්ධාගම අතර පැවති සබඳතා ගිලිහී තිබුණු බැවින් බුද්ධාගම සම්බන්ධයෙන් කිසියම් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සිදු නොවීය.[3] විශේෂයෙන්ම මෙම අවධිය වන විට උඩරට රාජ්‍ය ප්‍රබල දේශපාලන ප්‍රවාහය වූ අතර බෞද්ධාගමේ ආරක්ෂාව සම්බන්ධයෙන් උඩරට රාජ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

බ්‍රිතාන්‍ය ප්‍රථම ආණ්ඩුකාරවරයා වශයෙන් පෙඩ්රික් නොර්ත් වැඩ භාරගැනීමෙන් අනතුරුව අවධානය යොමු කළ පාර්ශව කිහිපයක් විය. ආර්ථික වශයෙන් වර්ධනය වී පැවති දුෂ්කරතා මගහරවා ගැනීමට ක්‍රියා කළ අතර. මෙරට පිරිහි යමින් තිබුණු ක්‍රිස්තියානි ආගමේ තත්ත්වය නගා සිටුවීම සඳහා වෙහෙස ගෙන ක්‍රියා කළේය. ඔහු පාලනය භාරගත්තා වකවානුව තුළ විශේෂයෙන්ම මුහුදුබඩ පළාත් කේන්ද්‍රකරගනිමින් පැවති ආගමික රටාව සංකීර්ණ විය. බ්‍රිතාන්‍ය යටත් ප්‍රදේශවල බහුතර ජනතාවගේ ආගම වශයෙන් තිබුණේ ප්‍රෙස්බිටිරියන් හා රොමානු කතෝලික යන දෙනිකායට අයත් ක්‍රිස්තියානි ආගමය. ක්‍රිස්තියානින්ගෙන් වැඩිදෙනෙකු කැල්වින් නිකාය ඇදහූ අතර අනෙක් අය රෝමානු ධර්මය ඇදවූහ. දෙවන තැන මහදාගමට හිමි වූ අතර බුද්ධාගම තුන්වන තැන ගත්තේය. ඊට අමතරව ලන්දේසින් විසින් යක්ප වන්දනාව යැයි හැඳින් වූ අන්තගාමි වන්දනා ක්‍රමයක් තිබුණි. මේ ආකාරයට මුහුදුබඩ පළාත්වල සාමාන්‍ය ක්‍රමයට වඩා ආගම් කිහිපයක් තිබුණි. මෙම කාලයේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් වූයේ සීග්‍ර ලෙස නාමික ක්‍රිස්තියානින්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීමය. එයට හේතු වූයේ මෙම කාලයේ අන්‍ය ආගම්වලට ක්‍රිස්තියානිය මගින් එල්ලකර තිබුණු බලපෑම් වූ බවට සැක නැත.

විශේෂයෙන්ම ඉංග්‍රීසි බලය පැවති ප්‍රදේශවල භික්ෂූන් සතුව මහත් බලයක් පැවතුණි. එය සමරහ විට මුදලි කෙනෙකුගේ බලයටත් වැඩි වී යැයි මේට්ලන්ඩ් විසින් පවසා ඇත.[4] දකුණු පළාතේ භික්ෂූන් වහන්සේලා සතුව එම පළාතේ වැසියන් කෙරෙහි වූ බලපෑම නිසා ලන්දේසීන්ගේ ආගමික ප්‍රචාරණ කටයුතු ඔවුන්ගේ පාලන හස්තය ඉවත්කර ගන්නවාත් සමගම අභාවයට ගියේය. මෙම කාලයේ නාමික ක්‍රිස්තියානින්ගේ තත්ත්වය පැහැදිලිවන අවස්ථාවක් වූයේ උසාවිවල දිවුරුම් දුන් විටය. උසාවිවල සාක්ෂි දෙන බොහෝ ගම්වාසීහු තමන් ක්‍රිස්තියානින් බවත්. එහෙත් බුදුන්වහන්සේ කරෙහි විශ්වාසය ඇති බවත් පළකළ අතර බෞද්ධ ක්‍රමයට අනුව දිවුරුම් දීමට කැමති බවත් දන්වා සිටියහ. මෙසේ ආගම ලබා තිබූ පසුබෑම නගා සිටුවීමට නොර්ත් ආණ්ඩුකාරවරයා ගත් පියවර අතර. ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරයට ඉගැන්වීමේ ක්‍රමයක් භාවිතා කිරීමත්. දිවයිනට පැමිණි ක්‍රිස්තියානි ආගමික පූජකවරුන්ට රජයේ අවසර උපකාර ලබා දී එමගින් ආගම පැතිරවීමත් විය.[5] මෙසේ ආගම ව්‍යාප්ත කිරීමට කටයුතු යෙදුවද බ්‍රිතාන්‍යයන් විසින් අන්‍ය ආගම් කෙරෙහි සහනශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබීය. ආගම සම්බන්ධයෙන් නෝර්ත්ගේ කාර්යක් වූයේ ආගම ඇදහීමේ නිදහස තහවුරු කරමින් නිකුත් කළ

1799 සැප්තැම්බර් 23 දා ප්‍රකාශනයයි.[6] ඕලන්ද පාලනය යටතේ මෙතෙක් පැවති ආගම සම්බන්ධ නීතිරීති සමහරක් මේ නිසා මග හැරුණි. එයින් පසුව මුහුදු බඩ පළාත්වල සිටි සෙසු ආගමික කොටස් වූ මලබාර්. මුස්ලිම් හා බෞද්ධයන්ට ද ආගම ඇදහීමේ නිදහස මේ නිසා සැලසුණි.[7] මේ අනුව පැහැදිලි වන්නේ නෝර්ත් පාලන වකවානුවේදී ක්‍රිස්තියානිය ප්‍රචාරය කිරීමට පියවරගත් අතර බුද්ධාගම ප්‍රමුඛ අන්‍ය ආගම් කෙරෙහි සහනශීලී භාවයකින් කටයුතු කළ බවකි.

නෝර්ත්ට පසු ආණ්ඩුකාර ධුරයට පත් වූයේ මෙට්ලන්ඩ්ය. ඔහු ක්‍රිස්තියානිය ප්‍රචාරය කිරීම සඳහා එතරම් දුරට ක්‍රියා නොකළත් ක්‍රියාශීලී පාලනයක් ඇතිකර සාර්ථක පරිපාලන ක්‍රමයක් ගෙන යාමට උත්සාහ ගෙන ඇත. මොහු මුහුදු බඩ පළාත්වල ආගමික සංවිධානයන් දෙස බැලූවේ දේශපාලන දෘෂ්ටි කෝණයකින්ය. ඒ නිසා ඔහු විවිධ ආගමිකයන්ගේ හා ඒ ඒ නිකායයන් වෙනුවෙන් යම් යම් ලාභ ප්‍රයෝජන සලසා දෙමින් ඔවුන් තම දේශපාලන වාසි තකා බඳු ගැනීමට කටයුතු සිදුකර ඇත. ඔහු මේ ක්‍රියා කලාපය එංගලන්ත සභාව. හා ඕලන්ද පල්ලිය සම්බන්ධයෙන් ද අනුගමනය කළේය. එපමණක් නොව බෞද්ධාගම සම්බන්ධයෙන් මෙට්ලන්ඩ් අනුගමනය කළ ප්‍රතිපත්තිය ද ඉතා වැදගත් වූවකි.[8] මුහුදු බඩ පළාත්වල විසූ සිංහලයන්ගෙන් වැඩිදෙනා බෞද්ධයන් වූ අතර නෝර්ත් අවධියේ මෙන් නාමික ක්‍රිස්තියානි පිරිස් සිටි බව පෙනේ. නමුත් බහුතරය විසින් බුදුන්ගේ ආගම ඇදහූ බව මෙට්ලන්ඩ් විසින් පෙන්වා දී ඇත.[9]

මෙට්ලන්ඩ් විසින් බෞද්ධයන් කෙරෙහි දැක් වූ සහනශීලී ආකල්පය තුළ දක්නට ලැබුණේ දේශපාලන අරමුණුය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙම කාලය වනවිට උඩරට රාජ්‍යයේ ප්‍රබලත්වය නිසා විය හැකිය. ආගමික සංස්ථාවක් වශයෙන් බෞද්ධ සංවිධානයට සම කළ හැකි කිසිවක් ලෝකයේ නැතැයි. ඔහු පැවසීමෙන් පෙනෙන්නේ බෞද්ධයන් සතුව තිබූ බලය ගැන ඔහු තරමක් අතිශයෝක්තියෙන් සිතා සිටි බවය. එයට හේතු වූයේ මුහුදුබඩ පළාතේ බෞද්ධ භික්ෂූන් සහ උඩරට රජතුමා අතර පැවති සමීප සබඳතාවයයි. කන්ද උඩරට රාජධානිය බෞද්ධයන්ගේ අන්තිම බලකොටුව විය. මුහුදු බඩ පළාත්වල බෞද්ධ භික්ෂූන් වහන්සේලා උපසම්පදාව සඳහා යාම මෙට්ලන්ඩ් හැඳින් වූයේ මුහුදුබඩ පළාත් තොරතුරු පැවසීමට ගිය ගමනක් ලෙසය. එසේ පැවසීමට හේතු වූයේ කන්ද උඩරට රජතුමා බෞද්ධයන්ගේ ප්‍රධාන ආරක්ෂකයා වීමය.[10] මේ නිසා මුහුදුබඩ පළාත්වාසීන් ගැන ද රජතුමා උනන්දුවෙන් පසු වූ බවට සැක නැත.

මුහුදුබඩ පළාත්වල බෞද්ධ භික්ෂූන් උඩරටට යාමට හේතු වූයේ වාර්ෂික උපසම්පදා උත්සවය නිසාය. ඊට අමතරව ඒ ඒ විහාරස්ථානයන්හි හෝ පරම්පරාවල නායක තනතුරු ප්‍රදානය කෙරුණේ කන්ද උඩරට රජතුමා විසින්ය. රජු හා භික්ෂූන් අතර පැවති සම්බන්ධතාවය බිඳීමට මේ අනුව මේට්ලන්ඩ් ක්‍රියා කරනු ලැබීය. ඒ අනුව ඒ ඒ ප්‍රදේශය වෙනුවෙන් බෞද්ධ භික්ෂූන්ගෙන් යුතු කාරක සභාවක් තැනීමට සූදානම් විය. භික්ෂූන් පිළිබඳව හෝ ඔවුන්ගේ ඉඩකඩම් හා ආගමික චාරිත්‍ර ගැන ඇතිවන ගැටළු නිරාකරණය කිරීමට මෙම කමිටුවට භාර විය. එපමණක් නොව භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වයට සරිලන පරිද්දෙන් තනතුරු ප්‍රදානය කිරීමට ද මේට්ලන්ඩ් අපේක්ෂා කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ උඩරටට සාපේක්ෂව ඉංග්‍රිසීන් බෞද්ධාගමික කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබාදුන් අතර එමගින් මෙරට බලය ස්ථාපිත කිරීමට ද උත්සුක වීමය. මෙම කොමිටියේ නායක ස්වාමීන් වූ කරතොට ධම්මාරාම හිමියන්ට බ්‍රිතාන්‍ය රජය විසින් වේතනයක් ද ගෙවනු ලැබීය. මෙයින් පැහැදිලි වන්නේ භික්ෂූන් මහනුවර රජු කෙරෙහි දේශපාලන වශයෙන් බිඳවා තම වාසියට යොදා ගැනීමට මේට්ලන්ඩ් සමත් වූ බවයි.

ලංකාවේ බෞද්ධ සංස්කෘතිය හා ශිෂ්ටාචාරය විනාශ කොට ක්‍රිස්තියානිය පැතිරවීමට නම් භික්ෂූන් හා ගිහියන් අතර භේදයක් ඇතිකළ යුතු බව මේට්ලන්ඩ් අවබෝධ කරගත්තේය. එහෙත් මෙය එතරම් පහසු වූයේ නැත. ගිහියන් සහ බෞද්ධයන් අතර පැවතුනේ දැඩි සම්බන්ධතාවයකි. දකුණු පළාතේ භික්ෂූන් අතර භේදයක් ඇතිකර එයින් තමාට වාසියක් ලබාගැනීමට හැකි බව ඔහු විසින් අවබෝධ කරගත් බව පෙනේ. මෙම කාලයේ ඉතා වැදගත් සගපරපුරවල් වූ බෝවල හා කරතොට තෙරුන් අතර තරගයක් ඇති කරවේ-හැල්ලේ හා මුල්කිරිගල පරම්පරා දෙක තුළ ගැටුමක් ඇති කිරීමට සමත් විය. එය තුළින් ඔහුට වැඩි වාසි අත් වූ නිසා එය උඩරටට එරෙහිව භාවිතා කොට තිබේ.

බුදුදහමත් සමග පැවති සම්බන්ධය මෙසේ වීමේදී ලන්ඩන් මිෂනාරීන්ට ද, ඕලන්ද පල්ලියට ද අධාර ලැබුණි. ආගම ව්‍යාප්ත කිරීමේ මාධ්‍යයක් ලෙස අධ්‍යාපනය භාවිතා කිරීම ගැන මේට්ලන්ඩ්ගේ අනුමැතිය හිමි නොවීය. නමුත් මව් රජය අධ්‍යාපනය ප්‍රචාරය කිරීම මගින් ආගම ව්‍යාප්ත කිරීමට හැකිබව පෙන්වාදුන් නිසා අධ්‍යාපනයේ අභිවෘද්ධියට ද ක්‍රියා කිරීමට ඔහුට සිදු විය. මේට්ලන්ඩ්ගෙන් පසුව ආණ්ඩුකාරධූරයට සර් රොබර්ට් බ්‍රවුන්රිග් පත් වී එතැන් සිට රජය හා ආගම අතර නව

කාල පරිච්ඡේදයක් උදා විය. මේ අනුව පෙනී යන්නේ උඩරට බලය හමුවේ බ්‍රිතාන්‍යයන් සිය බලය ගොඩ නගා ගැනීම සඳහා බුද්ධාගම සමග තරමක සහනශීලීභාවයකින් කටයුතු කළ බවයි. නමුත් බුද්ධාගම හා ඉංග්‍රිසීන් අතර සෘජු සම්බන්ධතාවයක් මෙම කාලයේ ගොඩනැගුනේ නැති බව පෙනේ.

1815 දී බ්‍රිතාන්‍යයන් විසින් යටත් කරගනු ලැබූ උඩරට ප්‍රදේශවල ඔවුන්ගේ සමාජ ප්‍රතිපත්තිය සකස්කර ගැනීමේලා සමකාලීනව සිංහලයන්ගේ බලපැවැත් වූ දේශපාලනික හා නොයෙකුත් ප්‍රායෝගික අවශ්‍යතා ද බලපෑවේය. එකල එංගලන්තයේ සිටි ඉවැන්ජලිකන්වාදීන්, උයෝගිතාවාදීන් හා රැඩිකල්වාදීන් මිනිස් සමානත්වය පිළිබඳ අදහස් දැක් වූ අතර ඔවුන් සමාජ ප්‍රශ්න සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තිය වඩාත් සංකීර්ණ විය. එයට ඉවහල් වූයේ යටත් විජිතවල ස්වදේශිකයන්ගේ තත්ත්වය නැන්විම සඳහා ඔවුන් බුද්ධාගම මිත්‍යා දෘෂ්ටික ආගමක් ලෙස විශ්වාස කරන ලදි. නමුත් ලංකාවේ බ්‍රිතාන්‍ය පාලකයෝ දේශීය ආගම් සම්බන්ධයෙන් හෝ වෙනස්කම් ඇති කිරීමට බොහෝ සෙයින් පසුබට වූහ.[11] දේශපාලන වෙනස්වීම් සමග සමාජ වෙනස්වීම් ද ඇති වීම ස්වභාවික කරුණකි. මේ තුළ රජය හා ආගම අතර සම්බන්ධතාවය කඩවීමට ද යම් ප්‍රමාණයකට ඉවහල් විය.

1815 දී උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍යයන් හට පවරා දුන් අවස්ථාවේදී ඔවුන් විසින් බුද්ධාගම සම්බන්ධයෙන් කුමන පිළිවෙතක් අනුගමනය කළ යුතු ද යන සංකීර්ණ ප්‍රශ්නය මතු විය. දේශපාලන හා ආර්ථික කරුණු සඳහන් කරමින් බුද්ධාගම හා සංඝ සංවිධානය. උඩරට දේශපාලනයෙන් එහි සමාජයේත් හිමිකරගෙන තිබූ වැදගත් ස්ථානය සමග ඉටුකළ වැදගත් කාර්ය භාරය අනිවාර්යෙන්ම සැලකිල්ලට ගැනීමට බ්‍රිතාන්‍ය පාලකයන්ට සිදුවිය. යම් ආකාරයකින් පැවති තත්ත්වයට එරෙහිව කටයුතු කළේ නම් යටත් විජිත පාලනය එවකට යුරෝපයේ බලපැවැත් වූ බුද්ධිවාදයෙන් පිළිගනු ලැබූ සමානාත්මතාවය පිළිබඳ අදහස හා නොගැළපෙන්නට විය. එනමුත් බුද්ධාගම සම්බන්ධ බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති හැඩගැස්වීමෙහිලා දේශපාලන සාධකය තීරණාත්මකව බලපෑවේය.

බුද්ධාගම හා බ්‍රිතාන්‍ය අතර පැවති සම්බන්ධතාවය පිළිබඳ තොරතුරු සෙවීමේදී එය සෘජු වශයෙන් වර්ධනය වන්නේ 1815 උඩරට

ඇදාගැනීමෙන් අනතුරුවය. උඩරට සහ බුද්ධාගම අතර පැවතියේ තද බැඳීමකි. පූජකයන්, විහාරස්ථාන හා ආගමික චතාවත් සම්බන්ධයෙන් යුතුකම් රැසක් ඉටු කිරිමට රජවරු බැඳී සිටියහ. පන්සල්වල නායකයින් පත්කිරිම, බස්නායක නිලමේවරු පත්කිරිම, ආගමික උත්සවවලට සහභාගිවීම මේ අතර ඉතා වැගත් යුතුකම් සේ සලකන ලදි. බුද්ධාගම හා රාජ්‍ය අතර සම්බන්ධය "වෙන් කළ නොහැකිය" යන හැගීම ජනතාවගේ සිත් තුළට ගැඹුරු ලෙස කාවැදී ඇති බව අවබෝධ කළ බ්‍රිතාන්‍යයන්ට උඩරට සාමකාමී පාලනය සඳහා යම් කිසි පොරොන්දුවක් බුද්ධාගම සම්බන්ධයෙන් දීමට සිදු විය. එබැවින් 1815 මාර්තු 2 දින උඩරට නායකයින් හා ඉංග්‍රීසි ආණ්ඩුව අතර ඇති වූ ගිවිසුමේ පස්වන වගන්තිය මගින් රජය සහ බුද්ධාගම අතර සම්බන්ධතාවය පැහැදිලි විය.

බ්‍රිතාන්‍ය පාලකයින් බුද්ධාගම කෙරෙහි කිසියම් හෝ ප්‍රතිපත්තියක් නොතිබුණු බැවින් උඩරට ප්‍රදේශයේ ආරම්භයේ සිටම බුද්ධාගම සම්බන්ධයෙන් අනුග්‍රහශීලි භාවයක් අනුගමනය කළහ. 1815 අත්සන් කළ ගිවිසුම මගින් බුද්ධාගම හා රජය අතර ප්‍රතිපත්තිය ප්‍රකාශ විය. "උඩරට නායකයින් හා ජනතාව විසින් අදහන බුදුන්ගේ ධර්මය නොනැසිය හැක. එහි අයිතිවාසිකම් හා ජනතාව, පූජනීය ස්ථාන තවදුරටත් ආරක්ෂා කරමින් පවත්වාගෙන යනු ලැබේ.[12]" මෙවෙනි පොරොන්දුදීමෙන් ක්‍රිස්තියානි රජය භික්ෂූන් හා විහාරස්ථාන දේවාල ආරක්ෂා කරන බව පොරොන්දු විය. ගිවිසුමේ මෙම වගන්තියෙන් අපහසුතාවයට පත් වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග් එමගින් බුද්ධාගම පැවති. දෘෂ්ටියට තමන් බලාපොරොත්තු වූවාට වඩා අවධාණාත්මක ආකාරයෙන් ආරක්ෂාව සලසාදීම සිදු වූ බව බ්‍රිතාන්‍ය යටත් විජිත භාර ලේකම්වරයා වෙත ලියා යැවීය.[13] තමුත් බුද්ධාගම සම්බන්ධයෙන් මෙවැනි ක්‍රියාමාර්ග ගැනීම ගැන ප්‍රොතෙස්තන්තවාදි නායකයින් සහ ඉවැන්ජලිකල්වාදින් දැඩි විරෝධතාවය දක්වනු ලැබිය. මෙම වගන්තිය මගින් උඩරට ප්‍රදේශවල ක්‍රිස්තියානි දහම වර්ජනය කිරීමෙන් බෞද්ධයින් එම ආගමට හරවා ගැනීමට එරෙහිව ක්‍රියාත්මක වේ යැයි බිය පළ කළහ.

එම වගන්තිය ඒ ආකාරයෙන් අර්ථ නිරූපනය නොකරන්නේ නම් අනාගත මිෂනාරි කටයුතු බුද්ධාගම උල්ලංඝනය කිරීමක් ලෙස භික්ෂූන් විසින් ඒවාට විරෝධය පෑම පටහැනි බව ඔවුහු තවදුරටත් කියා සිටියහ. ස්වදේශිකයන් අතර ක්‍රිස්තියානිය සාමකාමී අන්දමින් ප්‍රචාරයවීම වැළකී යන ආකාරයට බ්‍රිතාන්‍ය ආණ්ඩුව බුද්ධාගමට ආධාර දී ඇතැයි එංගලන්තය

තුළ විරෝධතා මතු විය හැකි බවටත් ඔවුන් විසින් කරුණු පෙන්වා දී තිබේ.[14] මේ සම්බන්ධයෙන් පිළිතුරු සැපයූ බ්‍රවුන්රිග් කියා සිටියේ වගන්තියේ අඩංගු "inviolabe" පදය කඩකළ හැක. නොහැකි නම් සිංහල වචනය වෙනුවට යෙදූ වචනයක් පමණක් බවද ලංකාව තුළ ක්‍රිස්තියානි ප්‍රචලිත කිරීමට තමන්ගත් ක්‍රියාවන් විස්තර කළ ඔහු. බෞද්ධ භික්ෂූන්, උඩරට වියන් සම්බන්ධයෙන් පවත්වන අතිමහත් බලය හා අලුත් ආගන්තුක ජන කොටස් සමග දේශපාලන සම්බන්ධතා පහසුකරවීම යන කරුණු හේතුකොට ගෙන යැයි බ්‍රවුන්රිග් විසින් සිය ස්ථාවරය පැහැදිලි කර තිබේ. මේ ආකාරයට මෙතෙක් කල් බෞද්ධාගමේ ආරක්ෂකයා වශයෙන් සිටි සිංහල රජතුමා වෙනුවට බ්‍රිතාන්‍ය වෙනුවෙන් පෙනී සිටි ආණ්ඩුකාරවරයා එහි ප්‍රධානියා බවට පත් විය. නමුත් ඉහතින් පෙන්වාදුන් පරිදි මෙම ගිවිසුමේ අන්තර්ගත කරුණු කල් යෑමෙන් වෙනස් කිරීමට බලාපොරොත්තු වන බව බවුන්රිග්ගේ ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

උඩරට ගිවිසුම අත්සන්කර ඉතාමත් සුළු කලක් තුළ බ්‍රිතාන්‍යයන් විසින් අවධානය යොමු කළ පාර්ශවයක් වූයේ දන්ත ධාතුව දළදා මාළිගාවට වැඩම කරවීම සඳහා උඩරට ප්‍රභූන් හා නායක ස්වාමීන් වහන්සේලාගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු සැලසීමයි.[15] චිරාත් කාලයක් තුළ මෙරට ජන සමාජයෙහි එල්බගත් මතයක් වූයේ දන්ත ධාතුව හිමිකර ගැනීම රට පාලනය සඳහා රජ කෙනෙකුට නීත්‍යානුකූල අයිතියක් උරුම වන බවයි. මෙම සම්ප්‍රදාය අතීතයේ සිටම ක්‍රියාත්මක විය. මෙවෙනි ක්‍රියාදාමයන් බ්‍රිතාන්‍ය පාලකයින්ගේ අනුග්‍රහය යටතේ දන්ත ධාතුව ආපසු වැඩම කරවීම ඔවුන්ගේ දේශපාලන ආධිපත්‍ය සඳහා ආගමික නීතියානුකූල බවක් ලබා ගැනීමට ගත් උත්සාහයක් සේ දැක්විය හැකිය.

ඩොයිලි වෙත මිත් අනතුරුව පැවරී තිබුණේ ඉතා විශාල වගකීමකි. දේශපාලන වෙනස්වීම් කෙරෙහි සිංහලයින් එතරම් සැලකිලිමත් නොවූවද ඔවුන් තම ආගම කෙරෙහි භක්තියක් දක්වන්නේ ය යන්න ඔවුන් හා පැවති චිරකාලීන ඇසුර නිසා හෙතෙම මනාව දැන සිටියේය. දන්ත ධාතූන් වහන්සේගෙන් තොරව කන්ද උඩරට රාජ්‍යයෙහි රාජ්‍ය බලයක් පැවතිය නොහැකිය යනු සිංහලයන් තුළ පැවති විශ්වාසය විය. යුද කල කොලාහල මධ්‍යයේ මහනුවරින් පිටතට ගෙනගිය දළදාව නැවත ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවය අවබෝධකරගෙන ඩොයිලි විසින් කටයුතු යොදන ලදි. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමේදී පැමිණිලිකර තිබුණු යුද්ධ භටයින්ගෙන් ජනතාවට සිදු වූ හිරිහැර. විශේෂයෙන්ම එක් අවස්ථාවකදී දළදා මාළිගයේ

සේවයේ යෙදී සිටි ආලන්ති අම්මා[16] කෙනෙකුට සිදු වූ අනවරය නිසා මෙබදු තත්ත්වයක් යටතේ දළදාව ආපසු වැඩමවීමෙන් ඊට ආරක්ෂාවක් නැතිවේදෝ භික්ෂූන් තුළ තිබුණු බිය නිසාත්, මේ කාර්ය සඳහා භික්ෂූන් තුළ අහිතව පාලනය යම් කිසි බියකින් පසුවන බව තේරුම් ගැනීම ඩොයිලිට අපහසු නොවිය. ඒ අනුව ඩොයිලිට දළදාව කොහේ වැඩසිටින්නේ ද යන්න සොයා ගැනීමට නොයෙක් කාර්යන් ඉටු කිරීමට සිදු විය.

ඒ අනුව දළදාව ආපසු වැඩමවා ගැනීමට හැකිවීම කන්ද උඩරට රාජ්‍ය තුළ ඉංග්‍රිසි රාජ්‍ය බලය තහවුරුවීම පිළිබඳ වැදගත් සිද්ධියක් හැටියට සලකන ලදී. සිංහල රාජ්‍ය හිමිකම පිළිබඳ සංකේතය වශයෙන් පිළිගෙන තිබුණු මේ උතුම් වස්තුව ආරක්ෂාකර ගැනීම සඳහා එය නැවත මහනුවරට ගෙන ඒමට ඩොයිලි විසින් හැම විටම විධිවිධාන යොදනු ලැබිය. ඔහු සිංහල රජු දවස පැවති සිරිත් විරිත් නොකඩවා පවත්වාගෙන යන බව දැක්වීමේ සලකුණක් වශයෙන් ඇහැලේපොළගේ උපදෙස් පරිදි දළදාව වැඩම වූ දින උභය විහාරිය භික්ෂූන් උදෙසා සාංඝික දානයක් පිරිනමනු ලැබීය.[17] සිංහල රජුන් දවස මෙවැනි කටයුත්තක් සඳහා යොදාගත්තේ මගුල් මඩුව වුව ද මේ අවස්ථාවේදී ඒ සඳහා පත්තිරිප්පුව ප්‍රයෝජනයට ගන්නා ලදී. සමහර විට එම ගොඩනැගිල්ල පිළිබඳ පූර්ණ අයිතිය භික්ෂූන් සතුවීම දැක්වීමේ සලකුණක් හැටියට මෙසේ වෙනස් කළා විය යුතුය. දානය සඳහා සම්පූර්ණ වියදම රජය මගින් දරණ ලද අතර එදින පහන් පූජාවක් ද පවත්වන ලදී. මේ තුළින් මුල් කාලයේ බුද්ධාගම සහ රජය අතර තිබූ සම්බන්ධතාවය සාමකාමී එකක් වූ බව පැහැදිලි වේ.

උඩරට ගිවිසුම් අන්තර්ගතව ඇති හා ඉන් අනතුරුව ආසන්න වශයෙන් අනුගමනය කළ බ්‍රිතාන්‍ය ආගමික ප්‍රතිපත්තිය හේතුකොටගෙන බ්‍රිතාන්‍ය පාලකයින් ආගමික සංස්ථාව තුළ පෙර උඩරට රජවරුන් හිමිකරගත් ස්ථානයට සමාන තත්ත්වයට පත් වූ බව පෙනේ. උඩරට රාජාණ්ඩුව යටතේ රජතුමා බෞද්ධාගමික ආයතනවල ප්‍රධාන ආර්ථික උපකරණය සහ ඒවායේ ප්‍රධාන ආරක්ෂකයා විය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය හා විනය ප්‍රධාන භාරකරු සහ ආරක්ෂකයා ද විය. එපමණක් නොව සංඝ සංවිධානයේ ඉහළම තනතුරුවලට පත් කළ නැනැත්තා සහ භික්ෂූන් වහන්සේලා ද දළදා මාළිගාවේ දියවඩන නිලමේ තනතුරුවලට ද රදළ ප්‍රධානීන් ද උඩරට රෙසිඩන්ට්වරයා ද ඩොයිලිගේ උපදෙස් මත බවුන්රිග් විසින් පත් කරණු ලැබිය. පැරණි සම්ප්‍රදාය වෙත පෙරලා

ගමන් කළ බ්‍රිතාන්‍ය පාලකයෝ මල්වතු සහ අස්ගිරි පාර්ශව සඳහා එක් නායක හිමිනමක් සහ අනුශාසක හිමිනමක් බැගින් පත් කළහ.[18] මෙලෙස ආගමික සංවිධානයේ ප්‍රමුඛ භික්ෂු හා ගිහි පත්විම් කිරීම හැරෙන්නට අවස්ථා කිහිපයක දී බ්‍රවුන්රිග් විසින් විහාර දේපළ සම්බන්ධව තඩු පුද්ගලිකව විනිශ්චය කළේය.

ගිවිසුම අත්සන්කර නොබෝ කලක් යාමට පෙර මතභේද උද්ගත විය. පෙර මෙන් රජ කෙනෙකු නොසිටීම හා විදේශීය පාලකයින් බලයට පත්වීම රාජාණ්ඩුව යටතේ රජය හා ආගමික සංවිධාන අතර පැවති සම්බන්ධතාවය දුර්වල කිරීමට තුඩුදුනි. බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුද්ධාගමට ඔවුන් දැක්වූ ආර්ථික අනුග්‍රහය ඉතාම සීමිත විය. ආණ්ඩුව විහාරවලට ඉඩම් ප්‍රදානය නොකළ අතර ලබාදුන් සහාය ආගමික ස්ථාන හා ඒවායේ චාරිත්‍ර පවත්වාගෙන යාමටත් නියමිත උත්සව පැවැත්වීමටත් සීමා විය. භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනයට ආධාර කිරීමට සහ ඔවුන්ගේ විනය ආරක්ෂා කිරීමට පෙර රජුට මෙන් තිබූ වගකීමෙන් බ්‍රිතාන්‍ය පාලකයෝ මුළුමනින්ම වාගේ ඉවත් විය. බුද්ධාගම යන මිථ්‍යාදෘෂ්ටික පදනම මත ඔවුන් එබඳු විෂයන් සම්බන්ධයෙන් පෙර සිට හැම රජ කෙනෙකුම විශේෂ උනන්දුවක් දැක්වූවා යැයි මෙයින් අදහස් නොකෙරේ. උඩරට සිංහල රජතුමා වෙනුවට පත්ව ආ ආණ්ඩුකරු විදේශකයෙකු හා ක්‍රිස්තියානියකු වූ නිසා භික්ෂූන් වහන්සේලා තුළ මෙන්ම ගිහියන් තුළ ද මානසික වශයෙන් විශාල හිඩසැක් නිර්මාණය කළේය. ගිවිසුම අත්සන්කර වැඩිකල් නොගොස් ස්වකීය ආගම ඉමහත් අවමානයට භාජනයට වේ යැයි බිය පළ කළ බෞද්ධ භික්ෂූන් බෞද්ධාගමේ සහ බෞද්ධ විහාරවල ආරක්ෂාව සඳහා සිංහල රජකෙනෙකු පත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ යෝජනාවක් පවා ගෙන ආ බව බ්‍රවුන්රිග් විසින් පෙන්වා දීමෙන් මෙම කාලය වනවිට කුමන තත්ත්වයක් උද්ගතවී තිබුණේ ද පැහැදිලි වේ.

ගිවිසුමේ පස්වන වගන්තිය සම්බන්ධයෙන් තරමක් අසුභවාදී දර්ශනයක් මව්රජය තුළ පැවති බව පෙනේ. එයට විරුද්ධව එංගලන්තයේ පවා උද්ඝෝෂණ ඇතිවන්නට විය. පෙරදිග රටවල ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කිරීමේ අසීමිත උද්යෝගයෙන් පසු වූ මිෂනාරි ගිවිසුමේ පස්වන වගන්තිය තිබීමෙන් අනාගතයේදී උද්ගතවිය හැකි තත්ත්වය සම්බන්ධයෙන් කලබලයට පත් වූහ. මිෂනාරි උද්ඝෝෂණ කුළුගැන්වූ එය රජය වෙත ගෙනා පුද්ගලයන් වූයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වූ ජේ. බටරවත් සහ විලියම් විල්බෆෝපාස්ය. කඩ කළ නොහැකි යන වචනය ඔවුන් විසින්

විවේචනය කරන්නට විය. ඒයට අනුව කවදා හෝ බයිබලය පුහුණු කිරීමටත්. බෞද්ධාගමේ සාමකාමී උපදෙස් නිසා කිතුදහමේ ප්‍රතිපත්තිවලටත් ක්‍රිස්තියානියට හරවා ගැනීමටත් බාධා පැමිණිය හැකි බව බටර්වත් විසින් පෙන්වා දෙනලදි. මෙයින් මවුන් ගිවිසුම මගින් අනාගතයේ ඇතිවිය හැකි අවධානම දුටු ආකාරයක් දක්නට ඇත.

1815 මාර්තු 10 දින දළදා මාලිගාවේ මල්වතු සහ අස්ගිරි විහාර දෙකේ භික්ෂූන්ගෙන් ආණ්ඩුකාරවරයාගෙන් නායකත්වයෙන් සාකච්ජාවක් පවත්වන ලදි.[18] ගිවිසුම අත්සන් තැබීමෙන් පසු දෙපක්ෂය හමු වූ පළමු වතාව මෙය විය. මල්වතු විහාරය වෙනුවෙන් කොබ්බෑකඩුවේ මහානායක හිමියන් සහ අස්ගිරි විහාරය වෙනුවෙන් යටවත්තේ නායක හිමියන් ප්‍රමුඛව උභය විහාරීය භික්ෂූන් වහන්සේලා මේ සාකච්ජාවට සහභාගී වූහ. ආණ්ඩුකාරතුමා භික්ෂූන්ගේ විමසීමෙන් අනතුරුව බ්‍රිතාන්‍ය රජය යටතේ උන්වහන්සේලාගේ විහාරස්ථානයන් එලෙස පවත්වාගෙන යාමටත්. බුද්ධාගමේ පැරණි සම්භාවනීය තත්ත්වයත් ආරක්ෂාකර දීමටත් බ්‍රිතාන්‍ය රජය මගින් වූ පොරොන්දුව නැවත සහතික කොට ප්‍රකාශ කරන ලදි. විජය රජු පටන් බෞද්ධාගමට සම්පූර්ණ ආරක්ෂාවත් ගෞරවයත් සැලසුණු අතර ආගම නිසා රටේ අභිවෘද්ධිය සැලසුණු බවත් ආගමේ පරිහානිය රටේ පරිහානිය බවත් ප්‍රකාශ කළ භික්ෂූන් වහන්සේලා එමනිසා ආගමේ පැවැත්මත්. ආරක්ෂාවත් සඳහා බ්‍රිතාන්‍ය මහ රජතුමා වෙනුවෙන් පොරොන්දු වන ආරක්ෂාවට ස්වකීය කෘතඥතාවය හිමිවන බව දන්වා සිටියහ.

පස්වන වගන්තිය මගින් බෞද්ධාගම සමගම දේවාගම ගැන ද සඳහන් කිරීම මෙහිදී පැහැදිලි කළ යුතු කරුණකි. බෞද්ධාගම යනුවෙන් අදහස් කරන ලද්දේ බෞද්ධ ධර්මය අඩංගු පොත්පත් එම විහාරස්ථාන භික්ෂූන් වහන්සේ. පුද සිරිත් විධි බවට සැක නැත. දේවාගම යනුවෙන් අදහස් කරන ලද්දේ මේ වනවිට බෞද්ධයන් අතර සුලභව පැවති හින්දු බෞද්ධ දෙවි දේවතා ඇදහිලි ක්‍රමයක්[19] විනා ආගමක් නොවේ. මෙම කාලයේ මහනුවර නගරය තුළ පැවතුණු විෂ්ණු කතරගම සහ නාථ දෙවිවරුන් අතර පූජනීය ඉඩම් අතුරින් විශාල දේවාලගම් මීට අයිති විය. එමනිසා උඩරට වැසියන්ගේ ආගම ගැන සඳහන් කිරීමේදී දෙවි දේවතා වන්දනා ක්‍රමය ඉන් බැහැර කළ නොහැකි විය. ගිවිසුම අත්සන් කර බ්‍රිතාන්‍ය පාලකයින් බෞද්ධ භික්ෂූන් මෙන්ම දේවාලවල බස්නායකවරුන් හා කපුරාළලා ද ඉහත රැස්වීමට කැඳවීමෙන් මේ කරුණ තවදුරටත් පැහැදිලි වේ.

බ්‍රිතාන්‍යයන්ගේ මෙම අනුග්‍රහශීලී ප්‍රතිපත්තිය නොතකා රාජාණ්ඩුව පැවති සමයේ රජය සහ බෞද්ධ සංවිධාන අතර පැවති සම්බන්ධතාව බ්‍රිතාන්‍යයන් යටතේ මුළුමනින්ම බිඳ නොවැටුනත් එය ක්‍රමයෙන් දුර්වල වන්නට මග පෑදුණි විශේෂයෙන්ම මෙම කාලයේ උඩරට සමාජය තුළ මේ ආකාරයට ඇතිවෙමින් පැවති අසහනය පිළිබඳ හෝඩුවාවල් ලැබුණ ද උඩරට ගිවිසුමේ පොරොන්දුවල වෙනසක් ඇති කිරීමට තරම් බ්‍රිතාන්‍ය පක්ෂය ඉක්මන්කාරී නොවීය. වසරක් පමණක් යනවිට කුමන්ත්‍රණය පිළිබඳ දැන ගැනීමට ලැබුණත් ඉක්මන් වීමට තරම් දෙයක් එමගින් පෙන්වීමට නොතිබුණි[20]. එහෙත් 1816 වන විට අවධානය යොමු කළ සිටිය නොහැකි තරම් කුමන්ත්‍රණ ද ඇතිවේ. එනම් බුරුම රටෙන් කුමරෙකු ගෙන්වා සිංහාසනාරූඪ කිරීමයි. සිංහලයකු රජ කිරීමට යෝජනා කිරීමෙන් හෝ ථෙරවාදී බෞද්ධ රටක කුමරෙකු ගෙන්වීමෙන් හෝ කාගේ හෝ සහයෝගය ලැබිය හැකියයි විශ්වාසයක් තිබුන නිසා මෙම යෝජනාව කාලෝචිත විය.

බ්‍රිතාන්‍යයෙන් උඩරට බෞද්ධ ආයතනයන්ට විවිධාකාරයේ අනුග්‍රහ දක්වන්නට විය. ගිවිසුමේ දෙන ලද පොරොන්දුවලට අනුව විහාර හා දේපළ ගම්වල පරිපාලනයෙහි කිසිදු වෙනසක් ඇති කිරීමට හෝ ඉඩම් කුලය රාජකාරි සේවාවන් පදනම් කොටගත් උඩරැටියන් හා ඔවුන්ගේ පූජනීය ස්ථාන අතර පැවති සමාජ හා ආර්ථික සම්බන්ධතාවලට බාධා පැමිණවීමට හෝ උත්සහ නොකළහ. ආගමික සංවිධානයේ ඉහළ පැවිදි සහ ගිහිපත්වීම් සඳහා සුදුසු පුද්ගලයන්ගේ නම් මුලදී පෞද්ගලිකවත්, කොමසාරිස් මණ්ඩලය පිහිටුවීමෙන් පසු ඒ මගිනුත් ආණ්ඩුකාරවරයා වෙත නිර්දේශ කිරීම සඳහා රෙසිඩන්ට්වරයාට බලය පැවරිණි. ආගමික සංවිධානවල රාජකාරි නිසියාකාරව ඉටුවෙනවා ද එවකට අවශ්‍ය ද්‍රව්‍ය නිසියාකාරව ලැබෙනවා ද යන්න සොයා බැලීමද කරණු ලැබීය. ඩොයිලිගේ මිය යැමෙන් පසු, රෙසිඩන්ට් තනතුර අහෝසි වී අධිකරණ කොමසාරිස්වරයාට එම බලතල හිමි වූ අතර බෞද්ධාගමත් භික්ෂූන් වහන්සේලාගේ විහාර හා දේවාලවලටත් පූර්ණ ආරක්ෂාව ලබාදෙන බවට බ්‍රිතාන්‍ය පාලකයින් යලි යලිත් ප්‍රකාශ කළහ.

එසේම මෙවකට ඉතාමත් පූජනීය වස්තුව වූ දළදා වහන්සේට අයිති අස්ථානගත රන්, රිදී, මුතු, මැණික් ආදිය නැවත ලබාදීමට බ්‍රිතාන්‍යයන් කටයුතු සැලසුවේය. නමුත් මේවා නැවත ලබාදීම ආණ්ඩුකාරයා සහ හමුදා නිලධාරීන්ගේ පෞද්ගලික අපේක්ෂාවන් අතර වූ ගැටුමක් විය.

ආණ්ඩුකාරවරයා පෙන්වා දුන් අදහස වූයේ ඔහුගේ තීරණ ක්‍රියාත්මක කිරීමත් බ්‍රිතාන්‍ය පාලකයින් විහාර දේපල ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දැක්වූ උනන්දුවත් දේශපාලන වශයෙන් ඉතා මැනවින් පැහැදිලි වන බවය. විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාලකයින් විසින් දළදා මාලිගාවේත් අනෙකුත් සමහර පූජනීය ස්ථානවලත් නඩත්තුවට සහ ආගමික උත්සව පැවැත්වීමට සිය අනුග්‍රහය සහ ආධාර ලබාදුන්හ. ඒ අනුව ආගමික උත්සවවලට අවශ්‍ය වූ ඇතුන්, රෙදි, ඇත් දත් ආදි ද්‍රව්‍ය ආණ්ඩුව විසින් භික්ෂූන්ට හා විහාරවලට ලබාදුනි.[21] ආගමික උත්සව පුද පූජා හා පූජනීය ස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා විහාර හා දේවාලගම් භුක්ති විඳි ජනයා විසින් මුදලින් කළ යුතු ගෙවීම් හා ඉටු කළ යුතු වූ රාජකාරි සේවාවන් ගැනීමෙත් බ්‍රිතාන්‍ය පරිපාලන නිලධාරීහු වැදගත් වූහ.

ගිවිසුම අත්සන් කොට බෞද්ධාගම හා රාජ්‍ය අතර පැවති සබඳතාවයන්ගේ ඉතාමත් දැඩි භාවය සනිටුහන් කළ අවස්ථාවන් දක්නට ලැබේ. එනම් 1815 දෙසැම්බර් මස මුස්ලිම් පෙරහැරක් පැවැත්වූ අවස්ථාවේදී මුස්ලිම්වරු තිදෙනෙක් මහනුවර නගරයේදී බෞද්ධ භික්ෂුවකට පහර දී ඔහුගේ වටාපත කැබලිවලට කඩා දමා ඇත. මෙම සිද්ධිය දැනගත් වහාම රජය විසින් පරීක්ෂණයක් පවත්වා වරදකරුවන් හඳුනාගත නොහැකි වූ හෙයින් ඔවුන් අල්ලා ගැනීම සඳහා රික්ස් ඩොලර් පනහක ත්‍යාගයක් පිරිනමන බවට දැන්වීමක් ප්‍රකාශ කොට, අනාගතයේ එවැනි මුස්ලිම් පෙරහැර පැවැත්වීමට තහනම් කිරීමට ද පියවර ගැනිණි.[22] එසේම බෞද්ධ භික්ෂූහු බෞද්ධාගම අතහැර ක්‍රිස්තියානිය වැළඳ ගැනීමට තම කැමැත්ත ප්‍රකාශ කරමින් ආණ්ඩුවට ලිපියක් ඉදිරිපත් කළහ. නමුත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකරු මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබීය.[23] එසේම බ්‍රිතාන්‍ය උඩරට ප්‍රදේශවල ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය නොකිරීමට ද වගබලාගත් බව පෙනේ. මේ තුළින් පැහැදිලි වන්නේ රජය හැකි සෑම අවස්ථාවකදීම උඩරටියන්ගේ විශ්වාසය දිනා ගැනීමට කටයුතු කළ ආකාරයයි. නමුත් අපට පෙනෙන ප්‍රධාන කරුණක් වන්නේ බ්‍රිතාන්‍යයින් බුද්ධාගම සම්බන්ධයෙන් අනුගමනය කළ අනුග්‍රහශීලී ප්‍රතිපත්තිය එහි ආයතනික භාවිතයට පමණක් සීමා කළ බවය. මෙයින් පැහැදිලි වන්නේ ඔවුන්ගේ ප්‍රතිපත්තියේ ගැබ්වී තිබූ අභිමතාර්ථ මූලමනින්ම දේශපාලන ඒවා වූ බවයි.

මෙම කාලය වන විට දක්නට ඇති ප්‍රධාන ලක්ෂණයක් වූයේ උඩරට රදළවරුන් තුළ මෙන්ම භික්ෂූන් වහන්සේලා තුළ ද බ්‍රිතාන්‍ය ආධිපත්‍යය ගැන ඒකමතික භාවයක් නොවූ බවයි.[24] වර්ෂ 1817 අවසාන

භාගයේදී උඩරට පළාත්වල කැරලිකාර තත්ත්වයක් උද්ගත විය. එහෙත් මේ වන විට ස්වකීය බලතල ක්‍රමයෙන් පිරිහීයන නිසා උඩරට රදලවරුන් සිටියේ මහත් කනස්සල්ලෙනි.[25] එසේම විදේශ ආණ්ඩුවක් කෙරෙහි ඔවුන් තුළ තිබූ ස්වභාවික අවිශ්වාසය නිසා බ්‍රිතාන්‍ය රජය කෙරෙහි පොදු ජනතාව ද කලකිරී සිටියහ. භික්ෂූහු ද මීන් වඩා අප්‍රසාද ජනක තත්ත්වයක සිටියහ.[26] මෙවැනි පසුබිමක් මත කැරැල්ලක් ඇතිවීම ස්වභාවික කරුණකි. කැරැල්ල ගැන බ්‍රවුන්රිග් ආණ්ඩුකරු කියනුයේ "යුරෝපීය පාලන ක්‍රමයෙන් බුද්ධාගමට හානියක් සිදුවිය හැකි යැයි උඩරට පළාත් වැසියන්ගේ මානසික වශයෙන් කාවදින ලද හැඟීම් ද එක් වූ බවය."[27] උඩරට පළාත් රුසක කැරැල්ල පැතිරී ගොස් තිබූ අතර දළදා වහන්සේ ඉතා සියුම් අන්දමින් තමන් අතට පත් කර ගැනීම කැරලි කරුවන් උද්යෝගිමත් කරන සිදුවීමක් විය.

1818 අවසාන භාගය වනවිට කැරැල්ල මුළුමනින්ම වටලා කැරලි නායකයින් ද සිරභාරයට ගැනීමට හැකි වූ හෙයින්, එම වර්ෂයේ නොවැම්බර් 21 වැනිදා එතෙක් උඩරට පළාත්වල පනවා තිබූ මාර්ෂල් නීතිය එක්තරා ප්‍රමාණයකට අවලංගු කරන ලදි. කැරැල්ල පහසු ලෙස මැඩපැවැත්වීමට හැකි වූ නිසා උඩරට පළාත් පාලනය සම්බන්ධයෙන් සවිස්තරාත්මක ප්‍රශ්න පත්‍රයක් ඇති කිරීමට බ්‍රිතාන්‍යයින්ට අවස්ථාව ලැබිණි.[28] මේ අවස්ථාවේ බ්‍රවුන්රිග්ගේ 1818 නොවැම්බර් 04 වන දින ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥා පනතින් පළාත් පාලනය සම්බන්ධයෙන් වැදගත් වෙනස්කම් රාශියක් ඇති කළේය. මෙම වෙනස්කම්වල ප්‍රධාන අංගයක් වූයේ උඩරට පළාතේ පාලනය සඳහා ආණ්ඩුවෙන් පත් කරනු ලැබූ වෙනම කොමසාරිස් මණ්ඩලයක් පත් කිරීමය. උඩරට නිත්‍ය නේවාසික නිලධාරී වූ ඩොයිලි මෙහි සභාපති විය.

1818 ප්‍රකාශය මගින් ආගමික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වැදගත් වෙනස්කම් ඇති විය. එම වෙනස්කම් බොහෝ දුරට ඉතාමත් අසීමිත වූ කොන්දේසිවලින් බුද්ධාගමට ආරක්ෂාව සැපයීමට පොරොන්දු වීමෙන් තමන්ට මුහුණ පෑමට වූ අපහසුතාවයන්ගෙන් මිදීමට බ්‍රවුන්රිග් විසින් ගනු ලැබූ පෞද්ගලික උත්සහයක් ලෙස පෙන්විය හැකිය. බුද්ධාගමේ ආරක්ෂාවට 1815 උඩරට ගිවිසුමේ විශේෂ වගන්තිය සම්බන්ධයෙන් මව් ආණ්ඩුව සැක සංකා පලකළ අතර එය ප්‍රොතෙස්තන්ත්‍ර වරුන්ගේ දැඩි විවේචනයට භාජනය විය. එම වගන්තියේ සිංහල තේරුම තමන්ට වාසිදායක ලෙස යළි කථනය කරමින් බ්‍රවුන්රිග් තමන්ගේ ස්ථාවරය නිවැරදි බව තහවුරු කිරීමට උත්සාහ ගත් නමුත් එම තත්ත්වය ඔහු අපහසුතාවයට පත් කළේය.

මේ අනුරින් දේශපාලන අවශ්‍යතාවය මත බුද්ධාගම සම්බන්ධව සිය අනුග්‍රහශීලි ප්‍රතිපත්තිය දිගටම ගෙනයන අතරම විවේචනවලින් බේරීම සඳහා තමන් අත්සන් කල නිත්‍යානුකූල ලියවිල්ල අවලංගුකර වචන වෙනස් කිරීමට බ්‍රවුන්රිග් අවස්ථාව ලබා ගත්තේය.[29] උඩරට ජනතාව විශාල ප්‍රමාණයක් කැරැල්ලට ආධාරදීම හා සම්බන්ධ වීම ස්වදේශීය ආයතන ආරක්ෂා කිරීමේ පොරොන්දුවෙන් තමන් මුදාහරන ලදැයි බ්‍රිතාන්‍ය ආණ්ඩුකරු තමන් මුහුණදුන් පෞද්ගලික ප්‍රශ්නයට විසඳුමක් සෙවීමටගත් උත්සහය යටත් විජිත මිපනාරින්ගේ අභිමතාර්ථ වලින් එල්ල වූ බලපෑම සමග එකතු විය. ඒ තුළ ක්‍රිස්තියානි මිපනාරින්ගෙන් එල්ල වූ බලපෑම්. අභිමතාර්ථය කැරැල්ල අවසන් වූ වහාම පැවති දේශපාලන වාතාවරණය තුළට මෙම ක්‍රියාමර්ග සලකා බලනවිට එය උඩරට ප්‍රධානීන්ගේ බලය හා බලපෑමක් ඇතිබව දැන සිටි බ්‍රවුන්රිග් කුමන්ත්‍රණ මෙහෙය වන්නක් ලෙස දිටිය. මේ හේතුව නිසා බුද්ධාගම පමණක් ආරක්ෂා කිරීමේ වග කීමෙන් ආණ්ඩුව ඉවත්වීම රජය හා බුද්ධාගම අතර පැවති සම්බන්ධය දුර්වල කිරීමටත් ඒ මගින් භික්ෂූන් වහන්සේලා සහ රදල ප්‍රධානීන්ගේ බලපෑම අඩු කිරීමටත් ගත් උත්සාහයක් වූ බවයි.

1818 න් පසු බ්‍රිතාන්‍යයන් බුද්ධාගමට අනුග්‍රහය දැක්වීම තරමක් අඩු වූ බව පෙනේ. එය පැහැදිලි වන්නේ බුද්ධාගමට අනුග්‍රහය දැක්වීමේ ප්‍රතිපත්තිය දිගටම ගෙනයෑමෙන් ඔවුන් වළක්වාලීමට 1818 ප්‍රකාශනයේ අඩංගු වූ අන්‍ය ආගම්වලට ආරක්ෂාව සලසන බව ප්‍රකාශ කල එම වගන්තිය හේතුවූ බවයි. ඒ අනුරින් ක්‍රියා කිරීමට ඔවුන් පොළඹවන ලද්දේ භික්ෂූන් වහන්සේලාගේ බලපෑම ඉමහත් වූ බැවිනි. 1818 ප්‍රකාශනය මගින් භික්ෂූන් වහන්සේලා බෞද්ධාගමික ආයතන වරප්‍රසාද ලත් තත්ත්වයට පත්කරනු ලැබීය. භික්ෂූන් වහන්සේලා සහ සියලුම ආගමික උත්සවලට හිමිවිය යුතු ගෞරවයන් දළදා මාලිගාවේ හා දේවාලවල බස්නායක නිලමේවරුන්ට මාලිගාගම් හා දේවාලගම් භාවිතා කිරීමේදි සාම්ප්‍රදායික දැකුම් හා පඬුරු ලබා ගැනීමට ද ඉඩ තිබුණි.[30] සියලු පත්වීම් සම්බන්ධයෙන් එබඳු දැකුම් පඬුරු අවලංගුකල බව පෙනේ. තවද ජනතාවගේ ආගමට ආධාරවන නියමයන්ට ආණ්ඩුවේ පක්ෂපාතිත්වය පෙන්වනු රිසියෙන් උඩරට ප්‍රදේශවල සියලු කුඹුරු සම්බන්ධයෙන් බලපෑ ධාන්‍ය බද්දෙන් විහාරගම්. මාලිගාගම් නිදහස් කරුණු ලැබීය.[31]

උඩරට සම්බන්ධයෙන් සියලු පත්කිරීම් කොමසාරිස් මණ්ඩලයේ නිර්දේශ මත ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබීය. අධිකරණ

ක්ෂේත්‍රයේ පවා භික්ෂූන් වහන්සේලාට තරමක් විශේෂ වරප්‍රසාද දී තිබුණි. ආණ්ඩුව දළදා මාළිගාවේ නඩත්තුවට අවශ්‍ය වූ යම් යම් භාණ්ඩ සහ ද්‍රව්‍ය ලබාදුන් අතර මහනුවර සිටි භික්ෂූන් වහන්සේලා කිහිප නමකට ද්‍රව්‍ය වලින් හෝ මුදලින් හෝ යම් යම් දීමනා ප්‍රදානය කළහ. පෙර රාජාණ්ඩුව දවස මෙන් කොමසාරිස් මණ්ඩලය භාරයේ පැවති දළදා වහන්සේ බ්‍රිතාන්‍ය පාලකයින්ගේ අනුග්‍රහය ඇතිව වරින් වර මහජනතාවට ප්‍රදර්ශනය කිරීමටත් පියවර ගත්තේය.[32] ආණ්ඩුව මෙකල ආරම්භ කොට තිබූ පන්සල් තැනීම සඳහා පාරම්පරික රාජකාරි ක්‍රමය යටතේ ජනතාවගේ අනිවාර්ය යුදසේවාවන් ලබා ගැනීමේ දී විහාර හා දේවාලගම් භුක්තිවිඳි පුද්ගලයින්ද යොදාගත් නමුත් ආගමික සේවාවන් ඉටු කිරීම සඳහා ඔවුන් වරින්වර ආණ්ඩුවේ සේවයෙන් නිදහස් කරනු ලැබීය. 1823 වනතුරුම බ්‍රිතාන්‍ය පාලකයෝ ක්‍රිස්තියානි මිෂනාරීන්ට උඩරට ප්‍රදේශවල ආගමික ප්‍රචාරක කටයුතු වලට ඇතුල් වීමට අවසර නොදුන්හ. 1818 න් පසුව ඔවුන් මේ ආකාරයට අනුග්‍රහශීලී ප්‍රතිපත්තිය හැඩගැන්වීමෙහිලා බලපෑ ප්‍රධාන සාධකය වූයේ දේශපාලන ඒවා බව ඒ අනුව පැහැදිලි වේ.

බවුන්රිග්ගේ සේවා කාලයෙන් පසු ආණ්ඩුකාරධූරයට පත් වූයේ එඩ්වර්ඩ් බ්‍රාන්ස්ය. ඔහු විසින් උඩරට හුදකලා භාවය නැති කිරීම සඳහා නව මාර්ග පද්ධතියක් ආරම්භ කිරීමට කටයුතු යොදනු ලැබීය. මෙම ආණ්ඩුකාරවරයා ස්වකීය පාලන යුගය තුළදී බෞද්ධ සංවිධාන කෙරෙහි දැක්වූ ආකල්පය යහපත් එකක් වූ බව පෙන්වීමට සාධක ඇත. උඩරට කැරැල්ලෙන් පසු දළදා වහන්සේගේ භාරකාරත්වය බෞද්ධ සංවිධානය අතර හොඳ හිත පැවතීමට බාධාවක් සේ බ්‍රාන්ස් විසින් සලකන ලදී. මේ නිසා එහි පාරම්පරික භාරකරුවන් වූ මහානායකහිමිවරුන් දෙදෙනා සහ දියවඩන නිලමේ වෙත දළදා වහන්සේගේ භාරකාරත්වය පිළිබඳ කිසියම් වගකීමක් පැවරීම සඳහා ඔහු විසින් පියවර ගත්තේය.[33] දළදාව තැන්පත්කර තිබූ කරඬුවල යතුරු මේ අය වෙත පවරනු ලැබූ අතර දළදා මාළිගයේ මුරට යොදා සිටි සෙබළුන්ගේ සේවාව ද එලෙසම පවත්වාගෙන ගියේය. එපමණක් නොව මෙම අවධියේදී අංග සම්පූර්ණ දළදා ප්‍රදර්ශනයක් ද පවත්වා තිබේ.

බ්‍රවුන්රිග්ගේ කාලයේ මෙරට මුල්බැසගත් මිෂනාරි ව්‍යාපාරය බ්‍රාන්ස්ගේ කාලයේ වැඩි දියුණු විය. මෙයින් පැහැදිලි වන්නේ රජය මඟින් ක්‍රිස්තියානි අභිවෘද්ධියට විශේෂයෙන්ම එංගලන්ත සභා පල්ලියේ ධර්ම ප්‍රචාරය කිරීම සඳහා අති විශාල මුදලක් වැයකළ බවය. මෙවැනි ප්‍රතිපත්තියක් නිසා පසු කාලයේදී ජාතික පල්ලිය නමින් හැඳින්වූ ප්‍රබල

ක්‍රිස්තියානි සංවිධානයක් මෙරට බිහි වූ අතර මෙම සංවිධානයත් සෙසු මිෂනාරි ව්‍යාපාරවල බලපෑම නිසා බෞද්ධාගම හා පැවති සම්බන්ධය ක්‍රමයෙන් ලිහිල් කිරීමට රජය පෙලඹුණේය.

1831න් පසු ආණ්ඩුකාරවරයාගේ සේවා කාලය අවසන් වූ විට මෙරට පාලන ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස කොල්බෲක් කැමරන් කොමිසම ලංකාවට පැමිණියේය. මෙම කොමිසම ලංකාවට පැමිණ ප්‍රතිසංස්කරණ සිදුකිරීමෙන් පසු මෙරට සමාජ ආර්ථික හා දේශපාලන යන සෑම අංශයකම විපර්යාසයක් ඇතිවිය. මෙම අවධිය වනවිට බ්‍රිතාන්‍ය රජය සහ බෞද්ධාගම අතර සම්බන්ධය ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයන් විසින් උග්‍ර ලෙස හා ප්‍රසිද්ධ ලෙස විවේචනයට භාජනය කරනු ලැබීය. ස්ටුවට් මැකෙන්සි ආණ්ඩුකාරතුමා විසින් එතෙක් පවත්වාගෙන ආ බෞද්ධ භික්ෂූන්ගේ නායක පදවි හා විහාරාධිපති තනතුරුවලට පත් කිරීමේ ආඥා පත්‍ර අත්සන් කිරීම නවතා දමනු ලැබීය. මෙම සිදුවීමත් සමග බ්‍රිතාන්‍ය රජයත් බෞද්ධාගමත් අතර සම්බන්ධය පිළිබඳ නව යුගයක් උදා විය.

කන්ද උඩරට ආගමික අංශයෙහිලා කෝල්බෲක් ප්‍රථමයෙන් අවධානය යොමු වූයේ ඔහු විසින්ම හඳුන්වන පරිදි ඉතා සංකීර්ණ වූ විහාර දේපල සතු ඉඩකඩම් ප්‍රශ්නය සම්බන්ධයෙනි.[34] ඉංග්‍රීසි රජය බෞද්ධාගමික කටයුතුවලට මැදිහත් වී ක්‍රියා කිරීම ගැන කොමසාරිස්වරුන්ගේ එතරම් ප්‍රසාදයක් නොවීය. මෙම ක්‍රියාවලිය මගින් රටේ දියුණුව ඇණ හිට ඇති බව පෙන්වා දුන්හ. විශේෂයෙන්ම මෙම අවධිය වනවිට පැවති බෞද්ධ අධ්‍යාපන ක්‍රමය පිරිහී අභාවයට ගොස් පැවති යල් පැනගිය ආයතනයක් ලෙස විග්‍රහ කර තිබේ. නමුත් ඔහුගේ මෙම ආකල්පය එක් අතකින් බෞද්ධ ආයතනවල අනුග්‍රහයකයින් දුර්වල කිරීමට හේතු වූ අතර.[35] අනික් අතින් මේ රටෙහි අධ්‍යාපනය කෙරෙහි හිමිකම් තහවුරු කර ගැනීම සඳහා ක්‍රිස්තියානි මිෂනාරීන්ට අනුබලය දීමක් විය.

මෙම ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම මගින් ප්‍රධාන යෝජනාවක් වූයේ පාරම්පරික රාජකාරිය අවලංගු කිරීමය. උඩරට පූජනීය ස්ථාන සතු ඉඩකඩම් වූ විහාරගම් හා දේවාලගම් පාලනය කිරීමේදී බ්‍රිතාන්‍ය රජය එම ආගමික සංස්ථාවන්ට හානි නොපැමිණෙන අයුරින් ක්‍රියා කළ යුතු විය. නමුත් රාජකාරිය විහාර දේවාලගම් කෙරෙහි තවදුරටත් පවත්වාගෙන යායුතු බව 1832/4/2/ දින ව්‍යවස්ථාව මගින් ප්‍රකාශයට පත්කරන ලදි.

පාලනය සම්බන්ධයෙන් මෙතරම් වෙනසක් කළ අවස්ථාවකදී පවා ආගමික අංශය එයින් මග හැරවීමෙන් පෙනෙන්නේ බෞද්ධාගම හා පැවති සම්බන්ධතාවයට පහර නොවදින අන්දමින් ක්‍රියා කිරීමට රජය වගබලා ගත් බවයි. විශේෂයෙන්ම හෝර්ටන් ආණ්ඩුකරු වෙනුවට 1837 ජේ.ඒ. ස්ටුවට් මැකෙන්සි ලංකාවේ ආණ්ඩුකාරවරයා වශයෙන් පත්ව ආවේය.[36] ආණ්ඩුකාර ධූරය භාර ගැනීමේදී එවකට යටත් විජිත ලේකම්වරයා වූ ග්ලෙනෙල්ග් සාමිවරයා විසින් ලංකාවේ පාලන කටයුතු ගෙනයායුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් පත්‍රයක් එවන ලදී.[37] ලංකාවේ ජනතාවගේ සදාචාරාත්මක හා ආගමික අධ්‍යාපනයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමට ඔහු වෙත පැවරී ඇති බලතල හා වගකීම මෙයින් දන්වා සිටියේය. ලංකාවේ මිෂනාරි කටයුතු කෙරෙහි රජය දැක්වූ ආකල්පය සම්බන්ධයෙන් ස්ථිරවූත් බරපතල වූත් වෙනසක් මේ උපදෙස් පත්‍රයෙන් පෙන්නුම් කරන බව කේ. එම්. ද සිල්වා මහතා ප්‍රකාශ කරයි.[38] ප්‍රධාන වශයෙන් උඩරට පළාත්වල මිෂනාරි ව්‍යාපාරය පැතිරයාම කෙරෙහි රජය දැක්වූ උදාසීන ආකල්පය වෙනස් කිරීමට ඉහත දැක්වූ උපදේශය හේතු විය. රජය විසින් ප්‍රථමවරට දිවයිනේ මිෂනාරි කටයුතුවලට ආධාරදීම පමණක් නොව එය ආණ්ඩුකාරවරයාගේ අවධානයට යොමුවිය යුතු අත්‍යවශ්‍යම කටයුත්තක් ලෙස සැලකීමට ද මෙම උපදේශ පත්‍රයෙන් අනුමැතිය ලැබුණි. එනිසා මෙය රජයත් ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයත් අතර ඇතිවූ සමීප සම්බන්ධය පෙන්නුම් කරන්නක් සේ සැලකිය හැකිය.[39]

මව් රජය ආගමික හා අධ්‍යාපනික කටයුතු කෙරෙහි දැක්වූ අකල්පය එකක් වුවද මැකෙන්සි පාලනය භාරගත් මුල් වකවානුවේදී මෙරට රජයත් එහි ආගමික සංස්ථාව වූ එංගලන්තයේ සභා පල්ලියත් අතර මතභේද පැන නැගුනි. රජු විසින් එම ආයතනයට වියදම් කරන විශාල මුදලට සරිලන සේවයක් එයින් සිදු නොවන බව සැලකීම මෙම මතභේදයට හේතු වූ බව පෙනේ.[40] නමුත් මෙබඳු ප්‍රතිවිරෝධයන් අතර ද මැකෙන්සි පාලනයේ මුල් වකවානුවේ කැපීපෙනෙන ලක්ෂණයක් වූයේ ඔහු ආගමික කරුණු සම්බන්ධයෙන් අපක්ෂපාති ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවය. ආණ්ඩුකරු බෞද්ධාගම සම්බන්ධයෙන් රජය විසින් මෙතෙක් පවත්වාගෙන ආ දේ වෙනසක් ඇතිකිරීමට කල්පනා නොකළේය. එයට විරුද්ධව දිගින් දිගටම උද්ඝෝෂණ ව්‍යාපාර ගෙනයන්නට විය.

මෙසේ මිෂනාරි උද්ඝෝෂණ ඉතා උග්‍ර වූ කලක් ලෙස 1840 දැක්විය හැකිය. රජය බෞද්ධාගමික කටයුතුවලට මැදිහත් වූ ආකාරය ගැන සර්

එමර්සන්ටෙනන්ට් ප්‍රධාන ශිර්ප තුනක් යටතේ සිය විග්‍රහය ඉදිරිපත් කර තිබේ. එනම්.

1. රජයේ නිලධාරීන් බුද්ධාගමේ ආගමික කටයුතුවලට සහභාගිවීම.
2. බෞද්ධ භික්ෂූන්ගේ පැවැත්ම සඳහා සහ බෞද්ධයන්ගේ වාර්ෂික උත්සව පැවැත්වීම පිණිස රජය මගින් කෙලින්ම මුදල් වෙන් කිරීම.
3. නායක පදවිවලට විහාරාධිපති පදවිවලට රජය භික්ෂූන් පත් කිරීම සහ දේවාලවල බස්නායකවරුන් පත් කිරීම.

ටෙනට් පෙන්වාදෙන ආකාරයට බ්‍රිතාන්‍ය රජය මේ ආකාරයෙන් බෞද්ධාගමික කටයුතු සඳහා මැදිහත්වී මෙබඳු සිරිත් පවත්වාගෙන යාමට හේතු වූයේ දේශපාලන කරුණු මූල්කර ගෙනය. සමාජයේ බලයක් ඇති පිරිසක් ලෙස මේ අවධියේ සිටි භික්ෂූන් හා දියවඩන නිලමේ ඇතුළු බස්නායක නිලමේවරුන්ගේ පක්ෂපාතිත්වය රජයට නොලැබී යාමෙන් පාලන දුෂ්කරතාවයන් ඇතිවීමටත් රාජ්‍ය විරෝධී කැරලි පැන නැගීමටත් ඉඩ තිබුණි. ඒ අනුව මෙම පිරිස් රජය මගින් පවත්වාගෙන යාමට හේතු වූයේ 1815 ගිවිසුමෙන් රජය වූ පොරොන්දුව හෝ පොරොන්දුවක කොටසක් ඉටුකිරීම සඳහා වූ බලපෑමක් නොවන බව ටෙනට්ගේ අදහස විය.

රජයේ පිළිවෙත මේ ආකාරයෙන් ක්‍රියාත්මක වුවත් බලවත් තත්ත්වයකට පත්වෙමින් සිටි මිෂනාරීන් විසින් දන්වා ඇත්තේ රජය විසින් බෞද්ධාගම අතර සම්බන්ධය ක්‍රිස්තියානි ආණ්ඩුවක් විසින් මිථ්‍යාදෘෂ්ටික ආගමක් විනාශවීමට නොදී පවත්වාගෙන යාමට දෙන ආධාරයක් ලෙසින් විග්‍රහ කරනු ලැබීය. මෙම ක්‍රියාව ජනතාව ක්‍රිස්තියානියට හරවා ගැනීම සඳහා ම දෙන ආධාරයක් ලෙසින් විග්‍රහ කරනු ලැබීය. ස්පෙන්ස් හාඩිගේ "බ්‍රිතාන්‍ය රජය සහ ලංකාවේ ප්‍රතිමා වන්දනාව" නම් ග්‍රන්ථය මගින් බ්‍රිතාන්‍ය රජයත් බෞද්ධාගමත් අතර සම්බන්ධකමේ ඉතිහාසය පමණක් නොව එම දෘෂ්ටි කෝණය අනුව බෞද්ධාගම හා එහි ඇදහිලි ක්‍රම පිළිබඳ විවරණයක් කරමින් රජය හා ආගම පවත්වාගෙන යන සම්බන්ධය වහාම අවලංගු කළ යුතු බව පෙන්වා දී තිබේ. රජයේ අනුග්‍රහය නිසා පොදු ජනතාව ආගම ඇදහීම පිළිබඳ අදහස හාඩි විසින් කොතරම් තදින් විශ්වාස කරන ලද්දේද යත් ලංකාවේ තවමත් අභාවයට නොගොස්

පැවතීමට එකම හේතුව රජය විසින් ඒ සඳහා අනුග්‍රහ දැක්වීම බව පෙන්වා දේ.[41] රජය විසින් බෞද්ධාගම සහ සම්බන්ධය පවත්වාගෙන යන්නේ හුදෙක් දේශපාලන හේතු නිසා මිස අන් කිසිත් උදෙසා නොවේ යන අදහස ස්පෙන්සර් හාඩි විසින් පෙන්වා දුන්නේය. මේ තත්ත්වය යටතේ බෞද්ධාගම හා බ්‍රිතාන්‍ය රජය අතර පැවති කවර හෝ සම්බන්ධයන් ඉතා ඉක්මණින් සම්පූර්ණයෙන් අවලංගු කළ යුතු බව තරයේ ඉල්ලා සිටි. බ්‍රිතාන්‍ය රජයත් බෞද්ධාගමත් අතර ජනතා සම්බන්ධතාවයට විරුද්ධව මෙසේ විද්වතුන්ගේ මතවාදයනුත් මිෂනාරි ව්‍යාපාරයෙන් එල්ල කරන ලද චෝදනාත් ලංකා රජය කෙරෙහි දෙවැදෑරුම් බලපෑමක් ඇති කිරීමට හැකිවිය. එනම් මෙරට රජය මිථ්‍යාදෘෂ්ටික ආගමක් සමඟ පවත්වන සම්බන්ධතා මේ දිවයිනේ ක්‍රිස්තියානිය පැතිරවීමේ ව්‍යාපාරයට බාධා පමුණුවන්නේ යයි යන අදහස එංගලන්තයේ ජනතාව තුළ ඇති කිරීමට සමත් විය. අනෙක් අතට මිෂනාරින් විසින් රජය හා බෞද්ධාගම අතර සම්බන්ධතාවයත් ප්‍රසිද්ධියේ දරුණු ලෙස විවේචනය කිරීමට ජනතාවගේ සිත් තුළට තම ආගම කෙරෙහි ශාංකාවක් හා භීතියක් ඇතිකරවීම ද කරණු ලැබීය. මේ ආකාරයට රජය හා ආගම අතර පැවති සම්බන්ධතාවයට එරෙහි උද්ඝෝෂණ ඇතිවෙමින් පවතින විට 1840 ඔක්තෝම්බර් 16 දින විධායක සභාවේදී ක්‍රිස්තියානියෙකු වශයෙන් බෞද්ධ පූජ්‍යස්ථානවලට සම්බන්ධ පදවිවලට පත්වීම් ආඥා පත්‍ර අත්සන් තැබීම තමාට තවදුරටත් කළ නොහැකි බවට සටහනක් ලියා තැබීය. විලියම් මැකෙන්සි විසින්[42] තමා පමණක් නොව අනාගතයේ කවුරු හෝ බෞද්ධාගමේ කටයුතුවලට මැදිහත්වීමෙන් අපහසුතාවයට පත්වීමට ඉඩ ඇති බව මෙයින් ප්‍රකාශ කරන ලදී.

එසේ වීමත් සමඟ සිය පත්වීම පිළිබඳ නීත්‍යානුකූල ආඥාපත්‍ර නොලැබීම නිසා වෙහෙර විහාර පාලනය සම්බන්ධ ප්‍රශ්න රාශියකට භික්ෂූන් වහන්සේලාට මුහුණ දීමට සිදුවිය. මැකෙන්සි ආණ්ඩුකාරතුමා 1841 මාර්තු මාසයේදී බෞද්ධ පත්වීම් අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් බෞද්ධයන්ට ඇතිවන සිත් වේදනා සහ පාඩුව පිළිබඳ කණගාටුව ප්‍රකාශ කළේය.[43] මේ සඳහා ගතයුතු පියවර පෙන්වීමේදී මැකෙන්සි විසින් මව් රජයට දන්වා යවන මෙන් සිය යටත් විජිත ලේකම්ට නියෝග කළ බවද පැහැදිලිය. අවුරුදු දහස් ගණනක් තිස්සේ සිංහල රජවරුන් විසින් බෞද්ධ පූජ්‍යස්ථාන ආරක්ෂාව හා ඒවායේ පාලනය සලකන ලද්දේ රජය සතු වගකීමක් ලෙසය. ඒ ඒ විහාරවල අධිපතින් පත් කිරීමේදී භික්ෂූන්ගේ

කැමැත්තට අමතරව රජුගේ අනුමැතිය සලකන ලද්දේ මේ දූතුකම පවත්වාගෙන යාමක් වශයෙනි. 1815 උඩරට ගිවිසුම අනුව සිංහල රජුගේ සියලුම දූතුකම්, අයිතිවාසිකම් ආරක්ෂාවීම පිළිබඳ අයිතිය බ්‍රිතාන්‍ය රජතුමා වෙත පැවරුනත් එය ඉටුකරණු ලැබුවේ ආණ්ඩුකාරතුමා විසින්ය. මැකෙන්සිට පෙර සිට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් සිංහල රජවරුන් තරම් නොවුන ද වගකීම් පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරණු ලැබීය. මැකෙන්සි අවසානයේ ගත් තීරණයෙන් වූයේ එම වගකීම පැහැර හැරීමකි. අත්සනින් තොර පත්වීම් ආඥා පත්‍ර වලංගු නොවූ බැවින් විහාරගම්වල පදිංචිකාරයන් බදු නොගෙවූ කල එයින් පැන නගින ප්‍රශ්න නිරාකරණය කිරීම අධිකරණය මගින් ප්‍රතික්ෂේප කරන ලද නිසා පාලනමය හා නීතිමය ප්‍රශ්න උද්ගත විය.

කැම්බල් ආණ්ඩුකාරවරයා 1841 - 47 කාලයේ මෙරට ආණ්ඩුකාරවරයා වශයෙන් වැඩ භාර ගැනීමෙන් අනතුරුව රජය හා ආගම අතර නව යුගයක් උදාවිය. නමුත් ආණ්ඩුවත් බුදුසමයත් අතර සම්බන්ධය පිළිබඳ දැක්වෙන ප්‍රශ්නය දිග්ගැස්සෙමින් තිබිණි. කැම්බල් උඩරට ගිවිසුම යටතේ බෞද්ධයන් විසින් භුක්ති විඳින ලද ඇතැම් වරප්‍රසාද හා අයිතිවාසිකම් එසේ පැවතීමට ඉඩ හැරියේය. බුදු සමයත් සමග පැවති මේ සම්බන්ධයට මිෂනාරීන් කිසිදු සතුටක් දැක්වූයේ නැත. මෙම කාලයේ පැවති දන්ත ධාතු ප්‍රදර්ශනයේදී ආණ්ඩුවේ නියෝජිතයන් සහභාගිවීමේ ප්‍රතිඵලයක් ලෙස විරෝධතා පෙර නොදුටු ආකාරයෙන් වැඩි දියුණු විය. මෙවකට පළ වූ ක්‍රිස්තියානි සගරාවල සිය විරුද්ධත්වය නොසඟවා එළිපිටම ප්‍රකාශ කළේය.[44] මේ පිළිබඳ ප්‍රචාරක කටයුතු ලංකාවෙහි පමණක් නොව ඉන්දියාවෙහි සහ බ්‍රිතාන්‍යයෙහි ද ගෙනයන ලදි.

1843 දන්ත ධාතු ප්‍රදර්ශනයක් පැවති අතර අස්ගිරි මල්වතු නායකහිමිවරුන්ගේ ඉල්ලීම පිට මහනුවර ඒජන්ත තැන වූ බුලර් මහතා ද ප්‍රදර්ශනයට සහභාගී විය. මෙතැන් පටන් බෞද්ධාගමට විරුද්ධව මතවාද වඩ වඩාත් වැඩි විය. බ්‍රිතාන්‍යයෙහි ඩර්මින්ප්යර්හි ජේම්ස් පෙගස් මේ සිද්ධිය පිළිබඳ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ අවධානය යොමු කරමින් පත්‍රිකාවක් පළ කොට යටත් විජිත ප්‍රධාන රාජ්‍ය ලේකම්වරයා වෙත යැවීය.[45] එම අවස්ථාවේදී ස්ටැන්ලිසමින්වරයා ලංකාවේ ආණ්ඩුකරුගෙන් වාර්තාවක් ඉල්ලා සිටියේය. එයට පිළිතුරු යැවූ ආණ්ඩුකරු හික්පුන් සුදුසු පරිදි පත්කරගත් විට ආණ්ඩුව පිළිගත් බව නවදුරටත් ප්‍රකාශ කළේය.[46]

ධාතු ප්‍රදර්ශනය ගැන කැම්බල්ගේ ප්‍රකාශය වූයේ බුදුරදුන්ගේ ධාතුව යැයි විශ්වාස කරණු ලබන දතක් බොහෝ කාලයක් පටන් ලංකාවේ බෞද්ධයන් සතුව ඇත. මෙහි චිත්‍රයක් ෆෝර්බිස් විසින් ලියූ "ලංකාව" නම් ග්‍රන්ථයේ දක්නට ලැබේ. මේ ධාතුව යමෙකු සතුව ඇත්නම් ඔහුට රට පාලනය නිරතුරුව කළ හැකි යැයි මිථ්‍යා විශ්වාසයක් පවතී. මේ දත විනාශ කිරීම හෝ පැහැර ගැනීම හෝ සුදුසු යැයි සර් රොබට් බ්‍රවුන්රිග් කල්පනා කළේ නැත.[47] ආදි වශයෙන් කරුණු දක්වා තිබේ. මෙම උත්සවයට ඒජන්තවරයා සහභාගී වූයේ දන්ත ධාතුවේ ආරක්පාව සඳහා යයි ඔහු විසින් ප්‍රකාශ කර තිබේ. තමාද මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ බව පිළිගත් ආණ්ඩුකරු තමාගේ නිලධාරීන්ගේ පවා මැදිහත් වීමක් සිදු නොවුණු බවද දක්වා ඇත.[48] මෙහිදී බුදු සමය හා ආණ්ඩුව සමග ඒනියා මැදිහත්වීමක් නැති බව ප්‍රකාශ කළ කැම්බල් පෙන්වාදුන් වැදගත් කරුණක් වූයේ බෞද්ධ පන්සල්වලට අයිති විශාල ඉඩම් ප්‍රමාණය පරිපාලනය කිරීමේ අවශ්‍යතාවයයි. විහාර සන්තක දේපළ ආරක්පා කිරීම පිළිබඳ වගකීම ආණ්ඩුව පැහැර හැරියොත් වැඩි කලක් යාමට පෙර ඒවා ගිහියන් අතට පත්වන බවත්, භික්ෂූන්ට ප්‍රයෝජනයක් නොවන බවත් ඔහු කියා සිටියේය.

මෙසේ බෞද්ධ භික්ෂූන්ට හිතකර වන අන්දමින් කැම්බල් ආණ්ඩුකාරතුමා විසින් කරන ලද තර්ක මහා ආණ්ඩුවට ඒත්තු ගැන්වීමට නුපුළුවන් විය. මොහු විසින් විධායක මණ්ඩලයෙහි සාමාජිකයන් අතර බෙදා හරින ලද ලුහුඬු වාර්තාවන් නිසා බෞද්ධ විහාර හා දේවාලවල කටයුතු සම්බන්ධයෙන් පැවති තත්ත්වය අනාවරණය කරන ලදි.[49] කලින් සිටි මැකේන්සි ආණ්ඩුකාරතුමා විසින් ආරෝපණය කරන ලද ආණ්ඩුවේ සම්බන්ධය අත්හිටුවීම පිළිබඳව අදාළ ලියවිලි ඉදිරිපත් කරමින්, තමාට හැකි ඉක්මනින් එබඳු පත්වීම් පිළිබඳව සියලුම මැදිහත්වීම් අත්හැරීමෙහි යෝජනාවක් ගැන තම පූර්වගාමියාගේ මතය හා එකඟවීමට කැමති බවද නමුත් පත්වීම පැවරිය හැකි සුදුසු පුද්ගලයෙකු හෝ මණ්ඩලයක් සොයාගැනීමට තමාට අපහසු වී ඇති බවද විධායක මණ්ඩලයට දක්වා සිටියේය.[50] බෞද්ධ ප්‍රශ්නය සම්බන්ධයෙන් කැම්බල් ආණ්ඩුකාර තැන වඩාත් නිදහස් ආකල්පයක් අනුගමනය කළ බව ඒ අනුව පැහැදිලි වේ. මව් රටින් පැමිණි බලවත් විරෝධතා මැද ද බුදුසමයෙහි යහපතට අදාල සහය කැම්බල් විසින් ලබා දුන්නේය.

මැකෙන්සි ආණ්ඩුකාරතුමා ගත් ඉක්මන් ක්‍රියාමාර්ගයේ ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වූයේ කැම්බල්ටය. බෞද්ධ පූජනීය ස්ථානවල

පරිහානිදායක තත්ත්වය ගැන පැමිණිලි හැම අතින්ම පැමිණෙන්නට විය. මතක් කිරීම් හා අභියාචනා කිරීම් ආණ්ඩුකරුගේ කාර්යාලයට ගලා එන්නට විය. නායක භික්ෂූන් පිළිබඳ ඇති දුරප්පාඩු කෙසේ පිරවිය යුතුදැයි ආණ්ඩුවේ ඒජන්තවරු උපදෙස් සෙවූහ.[51] මාතර, හම්බන්තොට, ප්‍රදේශවල නායක භික්ෂූන් පත්කිරීම, පත්තිනි දේවාලයෙහි හා අලවතුගොඩ දේවාලයෙහි බස්නායක නිලමේවරු පත් කිරීම පිළිබඳ ආණ්ඩුවේ ඒජන්තවරු විසින් තොරතුරු විමසා ඇත. මෙසේ ආණ්ඩුව බෞද්ධ ආයතන සමග කිනම් ආකාරයක හෝ සම්බන්ධතා වලින් මිදීමට බලවත් උත්සාහයක් දරණ විට ආගමික සිද්ධස්ථානවල පරිපාලනය අවුල් වෙමින් තිබිණ. මෙසේ බෞද්ධ ස්ථාන පිළිබඳ ප්‍රශ්නය අවුල් සහගත වූ විට එය විසඳීමේ අර්ථ සහිත ප්‍රායෝගික පියවරක් ගැනීමට කැම්බල් විසින් තීරණය කර තිබේ. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් හට දන්වා යැවූ අතර ඔවුන්ගේ පිළිතුරුවලින් පෙනී ගියේ බෞද්ධයන්ට තම විහාර දේවාලගම් රැකබලා ගැනීම පිණිස කිසියම් ක්‍රමයක් පිළියෙල කර නොදී බුදු සමය සමග ඇති සම්බන්ධතා බිඳදැමීමට කිසිම සාමාජිකයෙකුට නොහැකි බවය.

බුදු සමය සම්බන්ධයෙන් මෙසේ සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ කැම්බල් ආණ්ඩුකාරතුමා පන්සල් පිළිබඳව නායක භික්ෂූන් හා ප්‍රධානීන් තෝරන ක්‍රමය සඳහා සැලසුම් දෙකක් ඊට ඇතුළත් කළේය. මේවා පිළියෙල කරන ලද්දේ මධ්‍යම පළාතේ රජයේ ඒජන්තවරයා හා බටහිර පළාත් පිළිබඳව රජයේ ඒජන්තවරයා විසිනි.[52] කැම්බල් දෙපක්ෂයේම මත අවබෝධකර ගෙන බෞද්ධයන්ගේ යහපත සඳහා කිසියම් වැඩ පිළිවෙලක් යෙදීම සුදුසු බව කල්පනා කළේය. ඒ අනුව භික්ෂූන් හා ප්‍රධානීන් සමග සාකච්ඡා සම්මේලනයක් මහනුවර පැවැත්වීමට තීරණය කළේය. ඒ අනුව මෙම රැස්වීමට ආණ්ඩුකාරතුමාද සහභාගී වූ අතර, විහාරස්ථාන සම්බන්ධයෙන් කිසියම් හෝ පැමිණිල්ලක් ඇද්දැයි භික්ෂූන්වහන්සේලාගෙන් විමසා තිබේ. එහිදී බෞද්ධාගම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තියේ තිබෙන අවිනිශ්චිතභාවය පිළිබඳ කරුණු භික්ෂූන් වහන්සේලා විසින් ඉදිරිපත් කර ඇත.

බෞද්ධ ප්‍රශ්න විසඳීම සඳහා කැම්බල් ආණ්ඩුකාර තැන කළ හැකි හැම දෙයක්ම ඉතා ඉහළින් කරදීමට උත්සාහ ගත් නමුදු මේ බලාපොරොත්තු සම්පූර්ණ කර දීමට ඔහු අසමත් විය. කැම්බල් යෝජනා කරන ලද ක්‍රම සාමාන්‍ය අවස්ථාවකදී උද්ගත වූ ප්‍රශ්න විසඳීමට ප්‍රමාණවත් විය. එහෙත් මෙම අවධියේ මිෂනාරීන්ගේ බලපෑම් හමුවේ එය ක්‍රියාත්මක කිරීම අපහසු විය.

කැම්බල් ආණ්ඩුකරුට පසු ටොරින්ටන් සාමි මව් ආණ්ඩුවේ ප්‍රකාශිත ප්‍රතිපත්ති සිත්හි දරා ගෙන ලංකාවේ පාලන කටයුතු භාර ගත්තේය. මොහුගේ පාලන සමය ඇරඹීමත් සමග බුද්ධාගම සමග තිබූ බ්‍රිතාන්‍ය සම්බන්ධතාවයෙන් ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් දියුණු විය. මේ සම්බන්ධයෙන් සිදු වූ වැදගත් කාර්යක් නම් දන්ත ධාතුවේ භාරකාරත්වය බෞද්ධයන්ට පවරාදීමය. දන්ත ධාතුව ආපසු පවරා දීම පිළිබඳව ආණ්ඩුකාරතැන විසින් කැඳවනු ලදුව මහනුවර පවත්වන ලද විශේෂ සාකච්ඡාවේදී උඩරට ප්‍රධානීහු දන්ත ධාතුව ආපසු භාර ගැනීම සඳහා අනුගමනය කළ යුතු යැයි යෝජනා කරනු ලැබූ චාරිත්‍ර විධි ඇතුළත් ලියවිල්ලක් ඉදිරිපත් කළහ.[53] ආණ්ඩුකාරතුමා එහි යෝජනා ප්‍රශ්න කල විට සමහර යෝජනා බුද්ධ ධර්මයෙහි ඉගැන්වීම්වලට අනුකූල නොවන නිසා තමන් ඒ මතයට සම්පූර්ණයෙන් විරුද්ධ බව භික්ෂූන් උත්තර දුන්හ. කරඬුවෙහි යතුර භාරදීම සම්බන්ධයෙන් යම් යම් මතවාද ස්මතු වුවද ආණ්ඩුකාරතුමා එහි භාරකාරත්වය අස්ගිරි-මල්වතු උභය පක්ෂයෙහි භික්ෂූන්ට හා දියවඩන නිලමේට පවරා දුන්නේය. දන්ත ධාතුවත් ඊට සම්බන්ධ මැණික් හා දේපලවලත් ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ වගකීම මොවුන් තිදෙනාට පවරණු ලැබීය. ධාතු මන්දිරයෙහි යතුරු තුනක් සහ මාලිගාවෙහි යතුරු සර්. ඒ. ටෙනට් මැකාර්ති. සී. බියුලර් හා එම්. බර්නාඩ් යන අය ඉදිරිපිට පවරා දෙනලදි.[54] මේ ආකාරයෙන් බුද්ධාගම හා සම්බන්ධ වැදගත් වස්තුවක් පිළිබඳ ව ආණ්ඩුව මෙතෙක් කල මැදිහත් වීමෙන් ඉවත් වීමට හැකි විය. දළදාව භාර දී බෞද්ධ විහාර ඉඩම්වල පාලනය පිළිබඳ සංකීර්ණ ප්‍රශ්නය විසදිය යුතුබව ටොරිංටන් සිතුවේය. මේ අතර 1848 කැරැල්ල බ්‍රිතාන්‍ය රජයට විරුද්ධව ඇරඹුණ අතර කැරැල්ලේ නිර්මාතෘන් භික්ෂූන් හා ප්‍රධානීන් බව ආණ්ඩුකරුගේ යටත් විජිත ලේකම් සැක කළේය.[55] බෞද්ධාගම සහ විහාර ඉඩම් පිළිබඳ බ්‍රිතාන්‍යයන් විසින් ගෙනගිය ප්‍රතිපත්තිය මෙම කැරැල්ලට මූලික විය. ලංකාවේ එවකට ගණකාධිකාරි ලෙස කටයුතු කල සී.පී. මැකර්ති මහතා බ්‍රිතාන්‍ය රජයේ බෞද්ධ විරෝධී හා විහාර ඉඩම් පිළිබඳ ප්‍රතිපත්තිය දැඩි ලෙස විවේචනය කරමින් බෞද්ධාගම සමග සම්බන්ධය අතහැරීම සුදුසු නොවන බව පෙන්වා දුන්නේය.[56] 1848 කැරැල්ල බ්‍රිතාන්‍යයේ පවා විශාල ආන්දෝලනයක් ඇති වූ නිසා 1848 - 55 කාලයේ බුදුදහම සම්බන්ධයෙන් රජය මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. කැරැල්ල සමයේ සිංහලයන්ගෙන් බ්‍රිතාන්‍යයන් ලබාගත් දළදාව යළි 1853 මැයි 20 දා නැවත සිංහලයන්හට භාර දෙන ලදි. එනමුත් විහාර දේපල පිළිබඳ ප්‍රශ්නය ස්මතු වී බ්‍රිතාන්‍ය පාලකයින්ට මහත් කරදරයක් ගෙන දුන්නක්

බවට පරිවර්තනය විය. මේ අනුව 1815 උඩරට ගිවිසුමේ 5 වැනි වගන්තියෙන් දුන් පොරොන්දු කඩකරමින් 1853 වන විට සම්පූර්ණයෙන් බුද්ධාගම සමග පැවති සම්බන්ධය අතහැර දැමිය. මීට පසු විරාත් කලක් රජුන්ගේ ආරක්පාව යටතේ පැවති බෞද්ධාගමට හා බෞද්ධ ජනතාවට සරණ වීමට කිසිවෙකු නොසිටි නිසා අසරණ බවට පත්විය. මෙසේ බ්‍රිතාන්‍ය රජයේ බෞද්ධ ජනතාවට සරණ වීමට කිසිවෙකු නොසිටි නිසා අසරණ බවට පත්විය. මෙසේ බ්‍රිතාන්‍ය රජය බෞද්ධාගම සමග තිබුණු සම්බන්ධය අතහැරීම බෞද්ධ විහාර හා දේවාලවල ඉඩම් සම්බන්ධයෙන් පසුව ඇති වූ ප්‍රශ්නවලට මුල පිරිණි. රජයේ ආරක්පාවක් නොලැබූ විහාර ඉඩම් බ්‍රිතාන්‍යයන්හට පහසුවෙන් ලබාගැනීමට හැකිවිය. එතැන් සිට ඉතිහාසයේ දක්නට ලැබෙන්නේ අසරණ තත්ත්වයට පත් වූ විහාර සතු ඉඩකඩම් බ්‍රිතාන්‍ය ග්‍රහණයට ලක්වන අයුරුය.

මේ අවධිය වනවිට රජය උද්ගත වී පැවති තත්ත්වය තවදුරටත් බ්‍රිතාන්‍ය රජයට බලා සිටිය නොහැකි විය. මේ නිසා 1815 දුන් ප්‍රතිඥා තවදුරටත් සලකා බැලීම විශේෂයෙන් සිංහල රජු වෙනුවෙන් බෞද්ධාගම ආරක්ෂා කිරීමට පවරාගත් වගකීම්වලින් ඉවත්විය හැකි මගක් සොයා ගැනීමට පෙලඹවීම් ඇති වූ බව දක්නට ලැබුණි. ඒ අනුව 1846 අංක 2 දරණ ආඥා පනත මගින් උඩරට ප්‍රදේශවල ඇති විහාර. දේවාල ගම් පාලනයට අදාළ වූ නව විධි විධානයක් ඇති කරන ලදි. බෞද්ධ ප්‍රශ්නය නොවිසඳී දිග්ගැස්වීම බෞද්ධයන්ට මෙන්ම රජයට ද මහත් හිසරදයක් විය. මේ නිසා යටත් විජිත මහා ලේකම් වූ සර්. ජේ. එස්. පැකිටන් විසින් ආණ්ඩුව කරගෙන ආ පත්වීම් භික්ෂූන් වහන්සේලා විසින්ම කරගත හැකි වන පරිදි අවශ්‍ය විධිවිධාන සලස්වන ලෙස ජෝර්ජ් ඇන්ඩර්සන් වෙත දැන්විය.

ආගම සම්බන්ධයෙන් රජය අනුගමනය කළ ප්‍රතිපත්තිය බෞද්ධයන්ගේ සිත්වේදනා කරවන සුළු විය.[57] මෙතෙක් දළදා වහන්සේගේ භාරය පැවතුනේ සෙංකඩගල රජු කෙරෙහිය. මල්වතු අස්ගිරි සංඝ සභාදෙකෙහි නායකවරුන් පත්කරනු ලැබුවේද. විහාරාරාමයන් සතු දේපල පරිහරනය කරණුයේද. ඔහු විසිනි. මුලදී දළදා මාළිගය සම්බන්ධ චාරිත්‍ර බ්‍රිතාන්‍යයන් විසින් නිසියාකාරව ඉටුකරනු ලැබීය. උඩරට ප්‍රදේශ පාලනය කළ ඩොයිලි සහ ටනර්ට් යන බ්‍රිතාන්‍ය නිලධාරීහු සිංහල රජුන් කළ ආකාරයට භික්ෂූන්ට දාන දීම පවා කළහ. නමුත් කල් ගතවීමේදී දළදාවේ භාරකාරත්වය බ්‍රිතාන්‍ය රජය විසින් කළ යුතු නැතැයි යන මතයක් වර්ධනය විය. මෙයට

හේතු වූයේ මෙම කාලයේ පැවති ඉහතින් පෙන්වා දුන් බෞද්ධ විරෝධී ආකල්පයන්ය. විශේෂයෙන්ම අන්‍යාගමික ආවතේව කටයුතුවලට බ්‍රිතාන්‍ය රජු හවුල් නොවිය යුතු යැයි අදහස් විවේචකයන් විසින් ඉදිරිපත් කරන ලදහ. එම හේතු නිසා 1840 දී බුදුසමය පිළිබඳ ආගමික කටයුතුවලට සම්බන්ධ වීමෙන් වැළකුණහ. මේ නිසා 1847 දී දියවඩන නිලමේතුමා, සහ අස්ගිරියේ සහ මල්වතු විහාරවල මහානායක හිමිවරුන් දෙනම අඩංගු කොමටියක් යටතට දළදාවේ භාරකාරත්වය පැවරීමෙන් බ්‍රිතාන්‍ය රජය එම වගකීමෙන් මිදුනේය.[58] ඉක්බිතිව දළදා මැදුරේ නවත්වා සිටි බ්‍රිතාන්‍ය මුර සෙබලා එතැනින් ඉවත්කොට ධාතූන් වහන්සේගේ ආරක්ෂාව තරමක් අවදානම් කරන ලදි. මෙතෙක් කල් වාර්ෂිකව දෙනු ලැබූ (දළදා මන්දිරයට) රන් පවුම් 300 ක ආධාර මුදලද නතර කරන ලදි. මේ ආකාරයට රජය සහ ආගම අතර බිඳ වැටුණු සම්බන්ධතාවය 1848 කැරැල්ලට ද ඉවහල්විය. මෙම අවධියෙන් පසු ආගම සහ රජය අතර දුරස්ථ සම්බන්ධතාවයක් වර්ධනය වූ අවධියකි.

මේ ආකාරයට මිෂනාරීන්ගේ . බලපෑම් හමුවේ ගොඩනගාගත් නව ප්‍රතිපත්තිය නිසා රජය සහ ආගම අතර සම්බන්ධතාවයන් බෞද්ධාගමේ පිරිහීමට මහත් සේ බලපෑවේය. ඉංග්‍රීසි ආණ්ඩුව අනුගමනය කළ බෞද්ධ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් වශයෙන් 1855 වන විට බුද්ධාගම සම්බන්ධ කටයුතු සියල්ලම රජයේ බලපෑමෙන් තොරව බුඩිස්ට් ඒජන්සි (Buddist Agency) නම් මණ්ඩලයට භාර විය. ඒ අනුව ලංකාව යටත් කරගත් අවධියේ සිට බෞද්ධාගම හා රජය අතර පැවති සම්බන්ධතාවය යහපත් ආකාරයකින් පැවතුන ද එය නැති කිරීමට බ්‍රිතාන්‍යයන් ගනු ලැබූ උත්සාහය ඉහත වර්ෂයේදී සාර්ථක විය. ඔවුන්ගේ ප්‍රතිපත්ති කොතරම් සාර්ථකවිද යත් පණවා ඇති නීතිරීති නිසා අද පවා එම තත්ත්වයෙන් මිදීමට හැකි වී නැත. කෙසේ වුවද අප සාකච්ඡාවට භාජනය කළ අවධියේදී යම් යම් දුෂ්කරතා මධ්‍යයේ වුවද බුදු දහමේ අභිවෘද්ධියට ඉංග්‍රීසීන්ගෙන් පිටුවහලක් ලැබුණි. දහනම වන සියවසේ අගභාගයේදී ඇති වූ බෞද්ධාගමික පුනර්ජීවනයට මෙම කාලයේදී ලද අත් දැකීම් පිටුවහලක් වන්නට ඇතැයි මේ අනුව සිතිය හැකි වේ.

## පාදක සටහන

1. ජයවීර ඒ.එම්.එස්. *ලංකාවේ රාජ්‍ය සහ ආගම*, ඇම්පර් ප්‍රකාශනයකි. කැළණිය. 1991. පිටු 01.

එම. පිටු. 01.

වීරසේන. අයි.කේ. *ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ වාර්ෂික බෞද්ධ ප්‍රකාශනය* (19 කාණ්ඩය) 1963. පිටු 68.

*C.G.A. 5/78 Maitland to Secretary of State*, 28th Feb. 1870, p. 68

*University of Ceylon Review*, Vol. 11 No 11, P. 136

*University of Ceylon Review*, Vol. 11 No 11, P. 133

*C.G. A. 5/1 North to Secretary of State*, 17 Feb, 1805.

*C.U.B.* O Vol. 11, p. 253

*C.G.A. 5/78 Maitland to Secretary of State*, 20.Sept , 1806

*C.G.A. 5/78 Maitland to Secretary of State, 28. Feb.,1807*

*ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය බෞද්ධ ප්‍රකාශනය*. පිටු. 68.

*ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ වාර්ෂික බෞද්ධ ප්‍රකාශනය*. පිටු 69.

*Brownig to Batharst* 1815 CO, 54-58.

*Butterworth to Batharst*, 9 October 1815 CO, 54-58

*Colbrooks Report upon Administration* , 24 December, 1831 p. 122.

*Sinhala and the partsriots*, p. 40.

*Sinhala and the partsriots*, p. 45-50.

*Diary of John Doily*, 1810-1815p.229.

*Diary of john Doily* p.230.

වාවිස්සර හිමි. කොටගම. *සරණංකර සංඝරාජ සමය*. ගොඩගේ සහෝදරයෝ කොළඹ. 1964 පිටු. 8-9

*C.U.B. O Vol.* 11, p. 163.

Doily to Sutherland, 14 May, 1815.

Doily to Sutherland, 14 May, 1815.

Doily to Sutherland, 14 May, 1815.

ඉලංගසිංහ මංගල. *රජය ආගම හා අධ්‍යනය*. විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය. මොරටුව. 1980. පිටුව 96.

*C.U.B.* O Vol. 1, p. 160

*C.U.B.* O Vol. 1, p. 161

C.G.A. 5/8 *Bronrig to secretary of State*, 19 p.1818

The *History of the Ceylon Civil Service*, p. 109.

*Brownring to Batharst*, S, November, 1816.C. 54/61